# QUESTION BANK

YOUR E-LEARNING PARTNER

G.C.E. A/L

# ගිණුම්කරණය

Accounting

මාසික අධ්‍යාපනික සඟරාව


WWW.QUESTIONBANK.LK - YOUR E-LEARNING PARTNER

# විශේෂ පුණරීක්ෂණ අභ්‍යාස

# Special Revision Kit

Issue No-30
February 2024

## Revision Exercise
## Grade - 12

මෙම සඟරාව සෑම මසකම 15 වන දින පාසල් ගිණුම්කරණය විෂය භාර ආචාර්යවරයාට තැපැල් මගින් ලැබීමට සලස්වන අතර පාසල් දරුවන්ට මෙහි මෘදු පිටපත (Soft Copy) පහත දැක්වෙන වෙබ් අඩවියට පිවිසීම තුලින් නොමිලේ භාගත (Download) කල හැක.

FREE DISTRIBUTION ONLY

නොමිලේ බෙදාහැරීම සඳහා පමණි

මාර්ග ගත සඟරාව භාගත කිරීම සඳහා පිවිසෙන්න

WWW.QUESTIONBANK.LK

QUESTION BANK
YOUR E-LEARNING PARTNER

# ACCA SRI LANKA APPROVED LEARNING PROVIDERS (ALP) AND COMPUTER BASED EXAM CENTERS (CBE).

## Approved Learning Providers

* Achievers London Business School
* Icon Business School
* Alpha Business School (Pvt) Ltd
* Premier Partners
* Wisdom Institute for International Studies (Pvt) Ltd
* Onlineaccounting Learning (Pvt) Ltd

## Computer Based Exam Centers

* Achievers Lanka Business School
* Alpha Business School
* G A Academy (Pvt) Ltd
* Icon Business School (Pvt) Ltd
* Premier Partners Institute of Management
* Wisdom Institute for International Studies

**Before enrolling with ALP's Please contact ACCA Sri Lanka office**

ACCA Sri Lanka. Block A, 18 Floor, 33, Parkland, Park street, Colombo 2,
Hotline - 11 2424801 or 0773874247
Email - info@lk.accaglobal.com

*අ.පො.ස (උ. පෙළ)*

# 33 - ගිණුම්කරණය

නව නිර්දේශය

දැනුමෙන් සන්නද්ධ වූ අනාගත පරපුරක් බිහි කරනු වස් **QuestionBank.Lk** හා **ACCA (Sri Lanka)** ආයතන එක්ව සිදුකරන සමාජ සත්කාරයකි.මෙම සගරාවේ ***E - කලාපය*** පහත වෙබ් පිටුව තුලින් භාගත (Download) කල හැක.

**www.Questionbank.lk/CSR**

මෙම පෙරහුරු ප්‍රශ්න පත්‍රය ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේ ගණකාධිකරණ අංශයේ ආදි සිසුන් කණ්ඩායමක් සහ වරලත් ගණකාධිකාරීවරුන් දෙදෙනෙකු එක්ව නිර්මාණය කර ඇත.මෙය පුනරීක්ෂණ ප්‍රශ්න පත්‍රයක් වන අතර ඉලක්ක ගත හෝ අනුමාන ප්‍රශ්න පත්‍රයක් නොවේ.

# අ.පො.ස (උ. පෙළ)

# 33 - ගිණුම්කරණය

## නව නිර්දේශය

# QUESTION BANK

YOUR E - LEARNING PARTNER



**ප්‍රකාශනය හා අයිතිය**
Questionbank.lk (Pvt) Ltd
No - 11
මයුර මාවත
බෙල්ලන්විල
බොරැලැස්ගමුව
T.P – 077 3125364
Email – questionbank.lk@gmail.com

**අධීක්ෂණ සභාය**

ධනුෂ්ක මදුරංග
*ACA, BSc. Accounting (Sp) J'pura*
නාමල් දයාරත්න
*BSc. Administration (Sp) J'pura*
දිමුතු මධුසංක
*CBA, BSc. Accounting (Sp) J'pura*
අෂාන් චන්දිමාල්
*BSc. Accounting (Sp) J'pura*
ලහිරු බණ්ඩාර
*BSc. Finance (Sp) J'pura*

**නිර්මාණකරණය**

ගයාන් රුකාන්ත
*Dip in Graphic Design*

## පෙරවදන

ශ්‍රී ලංකා විභාග දෙපාර්මේන්තුව (2019) දී නිකුත් කල මූලාකෘති ප්‍රශ්න පත්‍ර ආකෘතිය සහ (2020) අ.පො.ස උසස් පෙළ විභාග ප්‍රශ්න පත්‍ර ආකෘතිය අනුව මෙම ප්‍රශ්න පත්‍රය සකස් කර ඇත.වරලත් ගණකාධිකාරීවරුන්ගේ අධීක්ෂණය යටතේ මෙම ප්‍රශ්න පත්‍රය සකස් කිරීම තුලින් ඉහල ගුණාත්මක තත්වයක් ආරක්ෂා කිරීමට අප බලාපොරොත්තු වුනෙමු.ඉතා ඉහල ගුණත්වයකින් යුත් ඉගෙනුම් ආධාරක දැයේ දූ දරුවන්ට නොමිලයේ ලබා දීම තුලින් සියලුම දූ දරුවන්ට අධ්‍යාපනයට ඇති සම අයිතිය තහවුරු කිරීමටත්, අධ්‍යාපනයට ඇති සාම්ප්‍රදායික බාධා ඉවත් කිරීමට සහ ගුරුවරුන්ට බාධාවකින් තොරව සිය ඉගැන්වීම් කටයුතු සිදු කිරීමට අවශ්‍ය සහාය ලබා දීම මෙම ව්‍යාපෘතිය තුලින් බලාපොරොත්තු වේ.

මෙම සගරාව සෑම මසකම 15 වන දින පාසල් ගිණුම්කරණය විශය භාර ආචාර්යවරයාට තැපැල් මගින් ලැබීමට සලස්වන අතර පාසල් දරුවන්ට සහ උපකාරක පන්ති ගුරුවරුන්ට මෙහි මෘදු පිටපත (Softcopy) පහත දැක්වෙන වෙබ් අඩවියට පිවිසීම තුලින් නොමිලේ භාගත (Download) කල හැක.

**www.questionbank.lk/CSR**

විශය ගැටලුවක් නිරාකරණය කරගැනීමට හෝ මෙම සගරාවේ පවතින සංකීර්ණ විශය කරුණක් නිරාකරණය කරගැනීමට පහත දැක්වෙන Whatsapp අංකයට හෝ Facebook පිටුවට කෙටි පණිවිඩයක් යොමු කරන්න.
Facebook – QuestionBank.lk
WhatsApp – 077 3125674

# REVISION EXERCISE

## Grade 12

(1) පොදු පරමාර්ථ මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් පහත දී ඇති කුමන ප්‍රකාශය /ප්‍රකාශ නිවැරදි වේද?

A. එය බාහිර පාර්ශවයන්ට තීරණ ගැනීම සඳහා අවශ්‍ය තොරතුරු සපයයි.
B. එය ආයතනයේ සංවිධානාත්මක මෙහෙයුම් කටයුතු සැලසුම් කිරීමට හා පාලනයට පිළියෙල කරයි.

1) A පමණි  2) B පමණි  3) A හා B පමණි
4) B හා C පමණි  5) A,B හා C සියල්ලම වේ.

(2) මූල්‍ය ගිණුම්කරණයේ ප්‍රධාන අරමුණ වන්නේ,

1) ගිණුම් ප්‍රමිතවලට අනුකූල වන පරිදි ගිණුම් සකස් කිරීමයි.
2) විගණකවරුන්ට අවශ්‍ය තොරතුරු සැපයීමයි.
3) ආයතනයට උනන්දුවක් දක්වන පාර්ශවයන්ට තීරණ ගැනීම සඳහා අවශ්‍ය ආර්ථික තොරතුරු සැපයීම.
4) කළමනාකරුවන්ට තීරණ ගැනීම සඳහා තොරතුරු ඉදිරිපත් කිරීමයි
5) ආයතනයකට උනන්දුවක් දක්වන බාහිර පාර්ශවයන්ට තීරණ ගැනීමට අවශ්‍ය තොරතුරු සැපයීම.

(3) පහත දැක්වෙන්නේ නෙත්මි ව්‍යාපාරයේ 2024.01.01 දිනට තිබූ මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයෙහි වටිනාකම් ය.

| **ජංගම නොවන වත්කම්** | + | **ජංගම වත්කම්** | = | **ජංගම නොවන වගකීම්** | | **ජංගම වගකීම්** | | **හිමිකම්** |
|---|---|---|---|---|---|---|---|---|
| 600 | + | 200 | = | 200 | + | 100 | + | 500 |

2024 ජනවාරි 02 දින පහත ගණුදෙනු සිදු වී ඇත.

I. බැංකු ණය වාරිකය රු. 52,000 ක් ගෙවන ලදි. ඒ තුල අඩංගු පොලිය රු. 2,000 කි.
II. රු.20,000 ක ලිපිද්‍රව්‍ය තොගයක් භාවිතයට ගන්නා ලදි.
III. ණයගැතියෙකුගෙන් රු.18,000 ක් ලැබුණි. දුන් වට්ටම 10% කි.

ඉහත ගණුදෙනු වලින් පසු නිවැරදි ගිණුම්කරණ සමීකරණය කුමක් ද?

රු. 000

| | **ජංගම නොවන වත්කම්** | + | **ජංගම වත්කම්** | = | **ජංගම නොවන වගකීම්** | + | **ජංගම වගකීම්** | + | **හිමිකම්** |
|---|---|---|---|---|---|---|---|---|---|
| 1) | 600 | + | 146 | | 148 | + | 100 | + | 500 |
| 2) | 600 | + | 146 | = | 150 | + | 100 | + | 496 |
| 3) | 600 | + | 126 | = | 148 | + | 100 | + | 478 |
| 4) | 600 | + | 126.2 | = | 150 | + | 100 | + | 476.2 |
| 5) | 600 | + | 126 | = | 150 | + | 100 | + | 476 |

(4) ව්‍යාපාරයක් පිරිවැය රු. 250,000 ක් වූ තොගයක් ණයට විකුණා ඇත. එම තොගයේ 18% ක VAT සහිත විකුණුම් මිල රු. 354,000 කි. මෙම ගණුදෙනුවේ බලපෑම නිවැරදිව නිරූපනය කෙරෙන ගිණුම්කරණ සමීකරණය වන්නේ,

| තොග | + | ණයගැතියෝ | = | හිමිකම + | වගකීම් |
|---|---|---|---|---|---|
| 1) (250,000) | + | 354,000 | = | 95,000 + | 54,000 |
| 2) (250,000) | + | 354,000 | = | 50,000 + | 54,000 |
| 3) (250,000) | + | 354,000 | = | 45,000 + | 54,000 |
| 4) (250,000) | + | 354,000 | = | 54,000 + | 50,000 |
| 5) (250,000) | + | 354,000 | = | 104,000 + | 0 |

(5) අමිල ව්‍යාපාරය 2024.01.01 දින කපිල ව්‍යාපාරයෙන් රු. 50,000 ක භාණ්ඩ ණයට ගන්නා ලදී. රු.15,000 ක භාණ්ඩ අදාළ පිරිවිතරයන්ට අනුකූල නොවූ බැවින් ආපසු යවන ලදී. ඉතිරිය සඳහා 10% ක වට්ටමකට යටත්ව චෙක්පතකින් ගෙවීම් කරන ලදී.
ඉහත ගණුදෙනු සඳහා කපිල ව්‍යාපාරය භාවිතා කල මූලාශ්‍ර ලේඛන පිළිවෙලින් දක්වා ඇති පිළිතුර කුමක් ද?

1) ඉන්වොයිසිය, බැරපත, ලදුපත
2) ඉන්වොයිසිය, හරපත, වවුචරය
3) ඉන්වොයිසිය, හරපත, ජ'නල් වවුචරය
4) ඉන්වොයිසිය, හරපත, බැංකු ප්‍රකාශය
5) වවුචරය, හරපත, වවුචරය

(6) ව්‍යාපාරයක් රු. 600,000 ක භාණ්ඩ ණයට ගන්නා ලදී. ඉන් රු. 100,000 ක් වටිනා භාණ්ඩ හානි වී තිබූ නිසා සැපයුම්කරු වෙත ආපසු යවන ලදී. මුදල් ගෙවීමේදී රු. 20,000 ක වට්ටමක් ලැබුණි. මෙම ගණුදෙනු ව්‍යාපාරයේ මූලික පොත් වල සටහන් කිරීමට අදාල මූලාශ්‍ර ලියවිලි වනුයේ,

| | ණයට ගැණුම් | ආපසු යැවුම් | ගෙවූ මුදල් | ලද වට්ටම් |
|---|---|---|---|---|
| 1) | ඉන්වොයිසිය | ජර්නල් වවුචරය | ලදුපත | වවුචරය |
| 2) | ඉන්වොයිසිය | බැරපත | වවුචරය | ගෙවීම් වවුචරය |
| 3) | ඉන්වොයිසිය | හරපත | වවුචරය | වවුචරය |
| 4) | ඉන්වොයිසිය | හරපත | ගෙවීම් වවුචරය | ගෙවීම් වවුචරය |
| 5) | ඉන්වොයිසිය | හරපත | ගෙවීම් වවුචරය | මූලාශ්‍ර ලියවිල්ලක් නැත. |

- **පහත ප්‍රශ්න ත්‍රිත්වය සඳහා පිළිතුරු සැපයීමට පහත තොරතුරු භාවිතා කරන්න.**

නිමල් විසින් කාවින්දට සිදුකල ණයට විකුණුම් වලට අදාළ තොරතුරු පහත දැක්වේ

| දිනය | ගණුදෙනුව |
|---|---|
| 2024.01.03 | ලකුණු කළ මිල රු. 90,000 ක් වූ බඩු තොගයක් 10% ක වෙළඳ වට්ටම් අඩු කර ණයට විකිණීම. (මෙම ලකුණු කළ මිල ගණනය කර ඇත්තේ පිරිවැයට 20% ලාභාන්තිකයක් තබා ගනිමිනි) |
| 2024.01.05 | ලකුණු කළ මිල රු. 8,100 ක් වූ භාණ්ඩ ආපසු එවීම. |
| 2024.01.31 | කාවින්ද විසින් ගෙවිය යුතු ශේෂය පියවීම. |

(7) මෙම ගණුදෙනු නිමල්ගේ ව්‍යාපාරයේ සටහන් කිරීමට යොදාගනු ලබන මූලික ලියවිලි අනුපිළිවෙළින් දක්වා ඇති ප්‍රකාශය වන්නේ,
(1) ඉන්වොයිසිය,බැරපත,ලදුපත.
(2) ඉන්වොයිසිය,හරපත,ලදුපත.
(3) ඉන්වොයිසිය,ජ 'නල් වවුචරය,ලදුපත.
(4) ඉන්වොයිසිය,බැරපත,ජ 'නල් වවුචරය
(5) ඉන්වොයිසිය,හරපත, ජ 'නල් වවුචරය

(8) මෙම ගණුදෙනු කාවින්දගේ ව්‍යාපාරයේ සටහන් කිරීමට භාවිතා කරන මූලික සටහන් පොත් අනුපිළිවෙලින්,

(1) ගැනුම් ජ'නලය, පොදු ජ'නලය, මුදල් ගෙවීම් ජ'නලය
(2) ගැනුම් ජ'නලය, ආපසු යැවුම් ජ'නලය, මුදල් ගෙවීම් ජ'නලය
(3) විකුණුම් ජ'නලය, ආපසු එවුම් ජ'නලය, මුදල් ලැබීම් ජ'නලය
(4) විකුණුම් ජ'නලය, ආපසු එවුම් ජ'නලය, පොදු ජ'නලය
(5) ගැනුම් ජ'නලය, පොදු ජ'නලය, පොදු ජ'නලය

(9) මෙම ගණුදෙනු හේතුවෙන් නිමල්ගේ ව්‍යාපාරයේ ශුද්ධ ලාභයට සිදුවන ශුද්ධ බලපෑම වන්නේ,

(1) රු. 6,000 න් වැඩි වේ.
(2) රු. 15,000 න් වැඩි වේ.
(3) රු. 4,650 න් වැඩි වේ.
(4) රු. 13,650 න් වැඩි වේ.
(5) රු. 14,580 න් වැඩි වේ.

(10) සීමිත ආසිරි පොදු සමාගමේ නිෂ්පාදන කටයුතු නිසා එහි වැඩ බිම අපවිත්‍ර වූ අතර පරිසර සංරක්ෂණ අධිකාරිය විසින් වැඩබිම පවිත්‍ර කල යුතුයැයි නියෝග කරන ලදී. මේ සඳහා රු. 200,000 ක මුදලක් 2023.03.31 න් අවසන් වසර සඳහා ප්‍රතිපාදනය කිරීමට තීරණය විය. පහත ගිණුම්කරණ සංකල්ප වලින් කුමන ඒවා ඊට බලපෑමක් ඇති කරයි ද?

A. ගිණුම්කරණ ඒකක    B - උපචිත    C - ආරක්ෂණ    D - ගැලපුම්

1) A,B හා C
2) A,C හා D
3) B,C හා D
4) C පමණි
5) A,B,C, හා D යන සියල්ලම

(11) භාණ්ඩ ගණුදෙනුකරුවන්ට බෙදා හරින අවස්ථාවේ දී, විකුනුම් ආදායම ආදායම් ප්‍රකාශයේ හඳුනාගොගැනීම සඳහා පහත කුමන ගිණුම්කරණ සංකල්පය පදනම් වන්නේද?

1) උපචිත    2) ගැලපුම්    3) කාලච්ඡේද    4) ආරක්ෂණ    5) උපලබ්ධි

(12) සීමිත නදුන් පොදු සමාගම 2023.03.31 දින ආදායම් ප්‍රකාශය හා මූල්‍ය තත්ව ප්‍රකාශය පිළියෙල කිරීමේදී රු. 50,000 ක වගකීම් සහතික සඳහා ප්‍රතිපාදනයක් සිදු කරන ලදී. මෙම ප්‍රතිපාදනය හා සෘජුවම සම්බන්ධ වන ගිණුම්කරණ සංකල්පය වනුයේ,

1) සංගතතා
2) ආරක්ෂණ
3) අඛණ්ඩ පැවැත්ම
4) කාලච්ඡේද
5) ගිණුම්කරණ යථාර්ථය

(13) වත්කම් වර්තමාන වෙළඳපොල මිලට අගය කොට දැක්වීමෙන් "අදාළත්වය" යන ගුණාත්මක ලක්ෂණය ආරක්ෂා වේ. නමුත් මෙමගින් කඩවීමට ලක්වන ගිණුම්කරණ සංකල්පය වන්නේ,

1) උපචිත
2) ගැලපුම්
3) ආරක්ෂණ
4) මූල්‍ය මිණුම්
5) ඓතිහාසික පිරිවැය

(14) දේපල පිරියත හා උපකරණ ක්ෂය වීම වියදමක් ලෙස ආදායම් ප්‍රකාශයේ හඳුනා ගැනීමට පාදක වන ගිණුම්කරණ සංකල්පය,

1) ඒකක
2) අඛණ්ඩ පැවැත්ම
3) ආරක්ෂණ
4) උපලබ්ධි
5) උපචිත

(15) විකුණුම් අත්තිකාරම් ආදායමක් ලෙස නොසැලකෙන්නේ මුදල් ලද නමුත් උපලබ්ධි වීම සිදු වී නොමැති බැවිනි. පහත කුමන සංකල්පය /සංකල්ප ඊට අනුකූල වේද?

A- උපචිත B-ගැලපුම් C-යථාරූපී D- උපලබ්ධි

1) A පමණි. 2) B පමණි. 3) C පමණි.
4) A හා D පමණි. 5) A හා B පමණි.

(16) ආපසු එවුම්, ආපසු යැවුම්, ගැනිලි හා අඩමාණ ණය වෙන්කිරීම යන ගිණුම් අනුපිළිවෙලින් වර්ග කරනුයේ පහත සඳහන් කුමන ආකාරයටද?

1) වියදම්, ආදායම්, වියදම්, වත්කම්
2) ආදායම්, වියදම්, වියදම්, වත්කම්
3) ආදායම්, වියදම්, හිමිකම්, වගකීම්
4) ආදායම්, වත්කම්, හිමිකම්, වත්කම්
5) ආදායම්, වියදම්, හිමිකම්, වත්කම්

(17) වත්කමක් මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ දැක්වීම සඳහා තිබිය යුතු නිර්ණායකය / නිර්ණායක ඇතුළත් ප්‍රකාශය වන්නේ,

A- අතීත ගණුදෙනුවක ප්‍රතිඵලයක් වීම.
B- ව්‍යාපාරයට නීත්‍යානුකූලව අයිතිවන
C- වර්තමානයේදී ව්‍යාපාරය විසින් පාලනය කරනු ලබන
D- අනාගත ප්‍රතිලාභ ගලා ඒමක් තිබීම

1) A, C හා D පමණි 2) A හා C පමණි 3) B හා C පමණි
4) A හා B පමණි 5) A,B,C හා D

(18) එකතුකල අගය මත බදු (VAT) සඳහා ලියාපදිංචි වූ ව්‍යාපාරයක් VAT රහිත රු.150,000 ක ලකුණු කල මිලක් සහිත භාණ්ඩ තොගයක් මුදලට විකුණන ලදී. එකතුකල අගය මත බදු ප්‍රතිශතය 18% ක් නම් හා වෙළඳ වට්ටම් රු. 30,000 ක් නම් මෙම ව්‍යාපාරයේ විකුණුම් ආදායම කොපමණද?

1) රු.120,000 2) රු.150,000 3) රු.138,000
4) රු.172,500 5) රු.132,000

(19) පහත සඳහන් හේතු නිසා 2023.03.31 දිනට ව්‍යාපාරයේ බැංකු ගිණුමේ ශේෂය එදිනට බැංකු ප්‍රකාශයේ ශේෂය සමග එකඟ නොවිය.

A. ඉදිරිපත් නොවූ චෙක්පත්
B. බැංකුව වැරදීමකින් බැර කර ඇති චෙක්පත් (වෙනත් ගිණුම් හිමියෙකුට අයත් චෙක්පත්)
C. අගරු චෙක්පත්

2023 මාර්තු මාසය සඳහා සකස් කරන බැංකු සැසඳීම් ප්‍රකාශයේ කුමන අයිතමය / අයිතම ඇතුළත් වන්නේද?

(1) A පමණි
(2) B පමණි
(3) A හා B පමණි
(4) A හා C පමණි
(5) C පමණි.

(20) අමිලා ව්‍යාපාරයේ 2023.03.31 දිනට ගලපන ලද බැංකු ශේෂය රු. 48,000 ක හර ශේෂයකි. එදිනට බැංකු ප්‍රකාශයේ ශේෂය රු. 52,000 ක හර ශේෂයකි. ශේෂ දෙකේ වෙනස සඳහා බලපා ඇති අයිතම ඇතුලත් කාණ්ඩය වනුයේ,

1) තැන්පත් කළ නමුත් උපලබ්ධි නොවූ රු. 102,000 ක චෙක්පත සහ නිකුත් කළ නමුත් නිෂ්කාශනය නොවූ රු. 2,000 ක චෙක්පත.
2) නිකුත්කල නමුත් නිෂ්කාශනය නොවූ රු. 2,000 ක චෙක්පත හා බැංකුව ස්ථාවර නියෝග යටතේ ගෙවන ලද රු. 100,000 ක රක්ෂණ වාරිකය හා රු. 3,000 ක බැංකු ගාස්තුව.
3) නිකුත් කල නමුත් නිෂ්කාශනය නොවූ රු. 12,000 ක චෙක්පත හා තැන්පත් කළ නමුත් නිශ්කාශනය නොවූ රු. 8,000 ක චෙක්පත.
4) තැන්පත් කළ නමුත් උපලබ්ධි නොවූ රු. 4,000 ක චෙක්පත.
5) නිකුත් කළ නමුත් නිෂ්කාශනය නොවූ රු.100,000 ක චෙක්පත.

**පහත ප්‍රශ්න ද්විත්වය සඳහා පිළිතුරු සැපයීමට පහත තොරතුරු භාවිතා කරන්න.**

➢ නිමල් ව්‍යාපාරයේ 2023.03.31 දිනට ණයගැති පාලන ගිණුම් ශේෂය රු. 98,000 ක් වූ අතර එදිනට පිළියෙල කල ණයගැති ශේෂ ලැයිස්තුවේ එකතුව වෙනස් අගයක් විය. පසුව කල විමර්ෂණයකදී පහත කරුණු අනාවරණය විය.

- ණයගැතියෙකුගෙන් කපා හරින ලද රු. 3,000 ක බොල් ණයක් ණයගැතියාගේ පෞද්ගලික ගිණුමේ සටහන් කර නැත.
- රු. 2,500 ක විකුණුම් ඉන්වොයිසියක් සම්පූර්ණයෙන් ම පොත්වලින් මඟ හැරී ඇත.
- ආපසු එවුම් රු. 8,000 ණයගැති පාලන ගිණුමට සටහන් කර නැත.
- ණයගැති ශේෂ ලැයිස්තුවට රු. 1,000 ක හර ණයගැති ශේෂයක් බැර ණයගැති ශේෂයක් ලෙස වාර්තා කර ඇත.

(21) 2023.03.31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ පෙන්නුම් කල යුතු ණයගැති ශේෂය වන්නේ,

1) රු. 106,000 2) රු. 93,500 3) රු. 100,500
4) රු. 92,500 5) රු. 90,000

(22) 2023.03.31 දිනට ගැලපුම් කිරීමට පෙර ණයගැති ශේෂ ලැයිස්තුවේ එකතුව හා නිවැරදි ණයගැති ශේෂ ලැයිස්තුවේ එකතුව

| | **ණයගැති ශේෂ ලැයිස්තුවේ එකතුව (ගැලපුම් වලට පෙර)** | **ණයගැති ශේෂ ලැයිස්තුවේ එකතුව (නිවැරදි)** |
|---|---|---|
| 1) | රු. 89,500 | රු. 98,000 |
| 2) | රු. 91,500 | රු. 92,500 |
| 3) | රු. 91,000 | රු. 92,500 |
| 4) | රු. 91,500 | රු. 89,500 |
| 5) | රු. 95,000 | රු. 89,500 |

(23) ව්‍යාපාරයක වත්කම් හා වගකීම් පහත දක්වා ඇත.

2023.03.31(රු.000) 2022.03.31 (රු.000)

| | | |
|---|---|---|
| වත්කම් | 5,200 | 2,800 |
| වගකීම් | 1,100 | 900 |

2023.03.31 දිනට වත්කම් තුළ නිරූපණය වූ තොගය රු. 100,000 න් අධි ගණනය වී ඇති බව පසුව අනාවරණය වී ඇත. වර්ෂය තුළ ගැනිලි රු. 150,000 ක් හා අතිරේක ප්‍රාග්ධනය රු. 300,000 ක් වේ. වර්ෂයේ නිවැරදි ශුද්ධ ලාභය වන්නේ,

1) රු. 1,900,000 2) රු. 1,850,000 3) රු. 2,250,000
4) රු. 1,950,000 5) රු .2,050,000

(24) වර්ෂය ආරම්භක දිනයේ උපකරණ අලුත්වැඩියාවට වැය කළ රු. 250,000 ක් උපකරණ ගිණුමේ බැරට රු. 200,000 ක් ලෙස සටහන් වී ඇත. උපකරණ වාර්ෂිකව පිරිවැය මත 10% ක් ක්ෂය කර ඇත.

මෙමගින් ඇති වූ අවිනිශ්චිත ගිණුමේ ශේෂය කීයද?

1) රු. 470,000 2) රු. 450,000 3) රු. 430,000
4) රු. 250,000 5) රු. 500,000

(25) ඩොල්ෆින් පිහිනුම් සංගමයේ පොත් වලින් පහත තොරතුරු උපුටා ගෙන ඇත.

| | **2022.04.01(රු.)** | **2023.03.31(රු.)** |
|---|---|---|
| හිඟ සාමාජික මුදල් | 5,000 | 10,000 |
| ඉදිරියට ලද සාමාජික මුදල් | 2,000 | - |

<u>2022/23 වර්ෂය තුල දී ලද සාමාජික මුදල්</u>

| | |
|---|---|
| 2021/22 සඳහා | 4,000 |
| 2022/23 සඳහා | 30,000 |
| 2023/24 සඳහා | 5,000 |

2022/23 වර්ෂයට අදාලව ආදායම් හා වියදම් ගිණුමට සටහන් කල යුතු සාමාජික මුදල් ආදායම වනුයේ,

1) රු. 46,000 2) රු. 41,000 3) රු. 51,000
4) රු. 30,000 5) රු. 35,000

(26) සමගි තරුණ කැළ සමිති සංවිධානයේ වත්කම් හා වගකීම් පහත පරිදි විය.

| **විස්තරය** | **2023.03.31 දිනට (රු.)** | **2022.03.31 දිනට (රු.)** |
|---|---|---|
| උපකරණ | 15,000 | 16,000 |
| හිඟ සාමාජික මුදල් | 2,000 | 4,000 |
| කලින් ලද සාමාජික මුදල් | 3,000 | 6,000 |
| පුස්තකාල අරමුදල | 45,000 | 25,000 |
| බැංකු | 50,000 | 20,000 |

2023.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා අතිරික්තය හෝ හිඟය (ඌණතාවය) කොපමණ ද? (ශුද්ධ වත්කම් පදනම යොදාගන්න)

1) රු. 19,000 2) රු. 10,000 3) රු. 29,000
4) රු. 50,000 5) රු. 59,000

**පහත ප්‍රශ්න ත්‍රිත්වය සඳහා පිළිතුරු සැපයීමට පහත සඳහන් තොරතුරු භාවිතා කරන්න.**

නෙත්ම හා නෙත්මි 2022.04.01 දින පහත එකඟතා මත හවුල් ව්‍යාපාරයක් ආරම්භ කරන ලදී.

- නෙත්ම ප්‍රාග්ධනය ලෙස රු. 5,000,000 ක් යෙදීම.
- නෙත්මි ප්‍රාග්ධනය ලෙස රු. 800,000 කට අගය කරන ලද බෙදාහැරීමේ රථයද, රු. 3,000,000 ක් මුදලින් ද යෙදීම.
- වාර්ෂික වැටුප්
  නෙත්ම - රු. 600,000
  නෙත්මි -රු. 500,000
- සෑම හවුල්කරුවෙකුටම ප්‍රාග්ධනය මත 10% ක වාර්ෂික පොලියක් ගෙවීම.
- ලාභ අලාභ සම සමව බෙදා ගැනීම.

2023.03.31 න් අවසන් වර්ෂයේ රු.2,100,000 ක ශුද්ධ ලාභයක් ලැබුනු අතර හවුල්කරුවන් තමන්ට හිමි ප්‍රාග්ධන පොලී හා වැටුප්වලින් 50% ක් මුදලින් ගෙන තිබුණි.

2023.03.31 දින නව හවුල්කරුවෙකු ලෙස මධුර බඳවා ගන්නා ලදී. එදින ඔහු රු.2,000,000 ක ප්‍රාග්ධනයක් රැගෙන එන ලදී. එදින හවුල් ව්‍යාපාරයේ කීර්ති නාමය රු. 900,000 කට තක්සේරු කල අතර එය හවුල්කරුවන්ගේ ප්‍රාග්ධන ගිණුම් මගින් ගැලපුම් කල යුතුය. නව හවුලේ ලාභ අලාභ නෙත්ම, නෙත්මි හා මධුර පිළිවෙලින් 3:2:1 අනුපාතයට බෙදාගත යුතුය.

(27) 2023.03.31 දිනට නෙත්ම හා රුවිරගේ ජංගම ගිණුම්වල ශේෂයන්

| | නෙත්ම(රු) | නෙත්මි (රු) |
|---|---|---|
| 1) | 1,105,000 | 945,000 |
| 2) | 610,000 | 420,000 |
| 3) | 610,000 | 500,000 |
| 4) | 1,160,000 | 940,000 |
| 5) | 60,000 | 60,000 |

(28) 2023.04.01 දිනට හවුල්කරුවන්ගේ ප්‍රාග්ධන ගිණුම්වල ශේෂයන් කොපමනද?

| | නෙත්ම(රු) | නෙත්මි (රු) | මධුර(රු) |
|---|---|---|---|
| 1) | 5,000,000 | 3,950,000 | 1,850,000 |
| 2) | 5,000,000 | 3,800,000 | 2,000,000 |
| 3) | 5,000,000 | 3,000,000 | 2,000,000 |
| 4) | 5,000,000 | 3,800,000 | 1,850,000 |
| 5) | 5,000,000 | 3,650,000 | 2,150,000 |

(29) 2023.03.31 දිනට හවුල් ව්‍යාපාරයේ හිමිකමේ සිදු වූ වැඩිවීම කොපමනද?

1) රු. 11,910,000
2) රු. 4,100,000
3) රු. 2,000,000
4) රු. 3,110,000
5) රු. 10,800,000

- පහත ප්‍රශ්න ද්විත්වය සඳහා පිලිතුරු සැපයීමට පහත තොරතුරු යොදගන්න.

ලාභාලාභ 2:2:1 අනුපාතයට බෙදාගනිමින් අනිල්,රනිල් හා සුනිල් පවත්වාගෙන ගිය හවුල් ව්‍යාපාරයෙන් 2022.04.01 දින සුනිල් විශ්‍රාම ගන්නා ලදී. කීර්තිනාමය ප්‍රාග්ධන ගිණුම් මගින් ගැලපීම සිදු කල අතර ප්‍රාග්ධන ගිණුම් සඳහා වෙනත් කිසිදු ගැලපීමක් නැත. අනිල් හා රනිල් සමාන හවුල්කරුවන් ලෙස ඉදිරියට හවුල් ව්‍යාපාරය පවත්වාගෙන යාමටත් රනිල්ට වාර්ෂිකව රු .240,000 ක වේතනයක් ලබා දීමටත් තීරණය විය. රනිල් රු. 200,000 ක් හවුල් වේතන වර්ෂය තුළ මුදලින් ලබා ගෙන ඇත. හවුල්කරුවන්ගේ ප්‍රාග්ධන හා ජංගම ගිණුම් ශේෂ පහත පරිදි වේ.

| | 2023.03.31 දිනට (රු) | | 2022.03.31 දිනට (රු) | |
|---|---|---|---|---|
| | ප්‍රාග්ධන ශේෂ | ජංගම ශේෂ | ප්‍රාග්ධන ශේෂ | ජංගම ශේෂ |
| අනිල් | 420,000 | 260,000 | 500,000 | 100,000 |
| රනිල් | 420,000 | 300,000 | 500,000 | 100,000 |
| සුනිල් | - | - | 300,000 | 100,000 |

(30) 2022.04.01. දිනට සුනිල්ට හිමි කීර්තිනාම කොටස සහ 2023.03.31 දිනට ව්‍යාපාරයේ මුලු හිමිකම කීයද?

| | **සුනිල්ගේ කීර්තිනාම කොටස 2020.04.01 දිනට (රු.)** | **මුලු හිමිකම 2021.03.31 දිනට (රු.)** |
|---|---|---|
| 1) | 160,000 | 1,600,000 |
| 2) | 160,000 | 820,000 |
| 3) | 80,000 | 820,000 |
| 4) | 160,000 | 1,400,000 |
| 5) | 80,000 | 1,400,000 |

(31) 2023.03.31 දිනෙන් අවසන් වර්ෂයේ විසර්ජනය කළ හැකි ශුද්ධ ලාභය,

(1) රු. 320,000 (2) රු. 560,000 (3) රු. 360,000
(4) රු. 520,000 (5) රු. 240,000

**පහත ප්‍රශ්න ත්‍රිත්වය සඳහා පිළිතුරු සැපයීමට පහත තොරතුරු භාවිතා කරන්න.**

3:2 අනුපාතයට ලාභාලාභ බෙදාගනිමින් මහේල හා අසේල පවත්වාගෙන යන හවුල් ව්‍යාපාරයට 2022.04.01 දින සුමේධ නව හවුල්කරුවෙකු ලෙස බඳවා ගන්නා ලදී. 2023.03.31 න් අවසන් වසර සඳහා පිළියෙළ කල හවුල්කරුවන්ගේ ජංගම ගිණුම් පහත දැක්වේ.

ජංගම ගිණුම්

| | මහේල | අසේල | සුමේධ | | මහේල | අසේල | සුමේධ |
|---|---|---|---|---|---|---|---|
| | | | | 2022.04.01 | | | |
| ගැනිලි | 10,000 | 10,000 | - | ශේෂය | 50,000 | 30,000 | - |
| ගෙවූ ප්‍රාග්ධන පොලී | 15,000 | 10,000 | 5,000 | ප්‍රාග්ධන පොලී | 30,000 | 20,000 | 10,000 |
| | | | | වේතන | 60,000 | 48,000 | 36,000 |
| | | | | ගෙවල් කුලී | 72,000 | - | - |
| 2023.03.31 ශේ/ප | 207,000 | 98,000 | 51,000 | ලාභ කොටස් | 20,000 | 20,000 | 10,000 |
| | 232,000 | 118,000 | 56,000 | | 232,000 | 118,000 | 56,000 |

**අතිරේක තොරතුරු,**

A. හවුල්කරුවන්ගේ ප්‍රාග්ධන ගිණුමේ ශේෂ සඳහා 10% ක වාර්ෂික පොලියක් හිමිවේ.
B. හවුල්කරුවන්ගේ ප්‍රාග්ධන ගිණුම් මගින් කීර්තිනාමය ගලපන ලදී. නව හවුල්කරුවෙකු රැගෙන ආ ප්‍රාග්ධනයත් කීර්තිනාමයත් හැර වෙනත් ගණුදෙනු ප්‍රාග්ධන ගිණුම් වල සටහන් කර නැත.
C. 2022.04.01 දිනට හවුල්කරුවන්ගේ ප්‍රාග්ධන ශේෂ
   මහේල -රු. 280,000
   අසේල - රු. 200,000

(32) නව හවුල්කරු බඳවාගත් දිනට හවුල් ව්‍යාපාරයේ මුලු කීර්තිනාමය කොපමණද?

1) රු. 480,000 2) රු. 80,000 3) රු. 40,000
4) රු. 20,000 5) රු. 100,000

(33) 2023.03.31 න් අවසන් වසරේ හවුල් ව්‍යාපාරයේ ශුද්ධ ලාභය කොපමණද?

1) රු. 406,000 2) රු. 50,000 3) රු. 356,000
4) රු. 254,000 5) රු. 326,000

(34) 2023.03.31 දිනට හවුල්කරුවන්ගේ හිමිකම වන්නේ,

1) රු. 956,000 2) රු. 600,000 3) රු. 480,000
4) රු. 356,000 5) රු. 80,000

(35) පහත දැක්වෙන එක් එක් අවස්ථාවට වඩාත් ගැළපෙන ගිණුම්කරණ සංකල්පය දක්වන්න.

1) වර්ෂය අවසාන තොගය, පිරිවැය හෝ ශුද්ධ උපලබ්ධි අගය යන දෙකෙන් වඩා අඩු අගයට අගය කිරීම. ..........................
2) විකුණුම් අත්තිකාරම් වගකීමක් ලෙස සටහන් කිරීම. ..........................
3) කල්බදු පදනමට අත්පත් කරගත් වත්කම මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ දැක්වීම. ..........................
4) වර්තමාන සාධාරණ වෙළඳපළ අගය වැඩි වුවත් ඉඩම් පිරිවැයට ගිණුම්වල වාර්තා වීම. ..........................

(36) පහත එක් එක ගණුදෙනුව වාර්තා කිරීමට අවශ්‍ය මූලාශ්‍ර ලියවිල්ල සහ අදාළ මූලික සටහන් පොත සඳහන් කරන්න.

| | ගණුදෙනුව | මූලාශ්‍ර ලියවිල්ල | මූලික සටහන් පොත |
|---|---|---|---|
| 1) | තොග ණයට ගැනීම | .......................... | .......................... |
| 2) | දුන් වට්ටම් | .......................... | .......................... |
| 3) | ණයහිමියෙකුට මුදල් ගෙවීම | .......................... | .......................... |
| 4) | ණයහිමියෙකුට භාණ්ඩ ආපසු යැවීම | .......................... | .......................... |

(37) අදාළ තීරුවේ √ ලකුණ යොදමින් පහත ප්‍රකාශ වල සත්‍ය හෝ අසත්‍ය බව දක්වන්න.

| | ප්‍රකාශය | සත්‍ය | අසත්‍ය |
|---|---|---|---|
| A- | නිෂ්පාදන පිරිවැය ගණනය කිරීමේදී සියලු පොදු කාර්යය පිරිවැය සැලකිල්ලට ගත යුතුය. | .......................... | .......................... |
| B- | අඩමාණ ණය වෙන්කිරීම ආරක්ෂණ සංකල්පයට අනුකූල වේ. | .......................... | .......................... |
| C- | අසම්භාව්‍ය වත්කම් මූල්‍ය ප්‍රකාශනවල හඳුනා ගත යුතුය. | .......................... | .......................... |
| D- | විකුණුම් ආදායමෙන් විචල්‍ය පිරිවැය අඩුකල විට සහභාගය ලැබේ. | .......................... | .......................... |

(38) පොදු ලෙජරයේ පවත්වාගෙන යනු ලබන පහත සඳහන් ගිණුම් වල නිවැරදි වර්ගීකරණය සඳහන් කරන්න.

| ගිණුම | වර්ගීකරණය |
|---|---|
| A - හානිකරණ අලාභ | ………………………… |
| B - වෙළඳ ලැබිය යුතු දෑ | ………………………… |
| C - ප්‍රත්‍යාගණන සංචිත | ………………………… |
| D - මුදලින් ලද එහෙත් නොඉපයූ ආදායම් | ………………………… |

(39) 2023.03.31 දිනට සමාගමක බැංකු ප්‍රකාශයේ ශේෂය රු. 180,000 ක් විය. එදිනට සමාගමේ බැංකු ගිණුමේ ශේෂය මීට වෙනස් විය. වෙනසට හේතු පහත දැක්වේ.

- බැංකුව විසින් නිත්‍ය නියෝග ගෙවීම. රු. 8,000
- බැංකුවේ තැන්පත් කරන ලද රු. 25,000 ක චෙක්පත මෙතෙක් උපලබ්ධි වී නැත.
- රු. 42,000 කට නිකුත් කරන ලද චෙක්පතක් මෙතෙක් නිශ්කාෂණය වී නොමැත.
- බැංකුවේ තැන්පත් කල රු. 12,000 ක චෙක්පතක් අගරු වී ඇත.

2023.03.31 දිනට පහත දෑ ගණනය කරන්න.

අ)සංශෝධිත බැංකු ශේෂය -රු…………………………………………..

ආ)ගැලපුම් කිරීමට පෙර සමාගමේ බැංකු ශේෂය -රු………………………………..

(40) ව්‍යාපාරයක් සම්බන්ධයෙන් 2023 වර්ෂයට අදාළව පහත තොරතුරු ඉදිරිපත් කර ඇත.

ගැණුම් - රු. 300,000
තොගයේ ශුද්ධ වැඩිවීම - රු. 50,000
දළ ලාභ අනුපාතය -20% (විකුණුම් මිලට)

2023 වර්ෂයේ පහත අයිතමවල අගයන් කවරේද?

A. විකුණුම් - රු……………………………………
B. විකුණුම් පිරිවැය රු. …………………………………..
C. දළ ලාභය - රු. ………………………………….

(41) සඳුන් හා නුවන් පිළිවෙලින් 3:2 අනුපාතයට ලාභාලාභ බෙදාගන්නා හවුල් ව්‍යාපාරයට රුවන් බඳවා ගන්නා ලදී. නව හවුල් ව්‍යාපාරය ලාභ අලාභ සමානව බෙදාගත් අතර රුවන් තම කීර්ති නාම කොටස ලෙස රැගෙන ආ මුදල රු. 10,000 කි. කීර්තිනාමය හවුල්කරුවන්ගේ ප්‍රාග්ධන ගිණුම් තුලින් ගලපනු ලබයි. රුවන් රැගෙන ආ කීර්ති නාමය සටහන් කිරීමට අදාල ජ 'නල් සටහන වන්නේ. (සංලක්ෂය අවශ්‍ය නොවේ)

……………………………………………………………………………………………………………
……………………………………………………………………………………………………………
……………………………………………………………………………………………………………

(42) ව්‍යාපාරයක් 2024 ජනවාරි මාසයේ ගැනුම් ජ'නලය එකතු කිරීමේදී රු. 20,000 ක් අධිගණනය කර ඇත. ආංශික තුලන ක්‍රමයට මෙම ව්‍යාපාරයේ ලෙජරය පවත්වාගෙන යයි. මෙම වරද නිවැරදි කිරීමට අදාල ජ'නල් සටහන් වන්නේ.(සංලක්ෂය අවශ්‍ය නොවේ.).

……………………………………………………………………………………………………………
……………………………………………………………………………………………………………
…………………………………………………………………………………………

**පහත ප්‍රශ්න ද්විත්වයට පිළිතුරු සැපයීම සඳහා පහත තොරතුරු භාවිතා කරන්න.**

2022.04.01 දින ව්‍යාපාර කටයුතු ආරම්භ කල සුනෙත් පොදු සමාගමේ 2023.03.31 දිනට ණයගැති උප ලෙජරයේ ශේෂ ලැයිස්තුවේ හර ශේෂයන්ගේ එකතුව රු. 95,000 ක් ද, රු.5,000 ක බැර ශේෂයක් ද විය. එය එදිනට ණයගැති පාලන ගිණුමේ හර ශේෂයට අසමාන විය. අසමාන වීමට හේතු පහත දැක්වේ.

1. දුන් වට්ටම් රු. 10,000 ක් ණයගැති පාලන ගිණුමේ සහ දුන් වට්ටම් ගිණුමේ සටහන් නොවීම.
2. ණයහිමියන්ට හිලව් කල රු. 4,000 ක් ණයගැති පාලන ගිණුමේ සටහන් නොවීම.
3. විකුණුම් ජ'නලයේ එකතුව රු. 32,000 ක් රු.23,000 ක් ලෙස ගිණුම් වල වාර්තා වීම.

මෙම ව්‍යාපාරය විසින් ගිණුම් වර්ෂය අවසානයේ ණයගැති ශේෂය මත 10% ක් හානිකරණ අලාභ සඳහා ඉඩහැරීම සිදු කෙරේ.

(43)

I 2023.03.31 දිනට නිවැරදි ණයගැති පාලන ගිණුමේ ශේෂය රු…………………………………………….

II හානිකරණ අලාභ (අඩමාණ ණය) සඳහා ඉඩ හැරීමට අදාල ජ'නල් සටහන්

…………………………………………………….හර

…………………………………………………….බැර

(44) සුනෙත් පොදු සමාගමේ 2023.03.31 දිනෙන් අවසන් වර්ෂයේ ශුද්ධ ලාභයට ඉහත නිවැරදි කිරීම් නිසා ඇති වූ බලපෑම කීයද?

…………………………………………………………………………..

(45) Super Star ක්‍රීඩා සමිතියේ 2022.04.01 දිනට හිමිකම පහත දැක්වේ.

| | |
|---|---|
| සමුච්චිත අරමුදල | රු. 300,000 |
| ගොඩනැගිලි අරමුදල | රු. 420,000 |
| යාවජීව සාමාජික අරමුදල | රු. 180,000 |

- 2023.03.31 දිනෙන් අවසන් වර්ෂය තුළ ගොඩනැගිලි අරමුදල භාවිතා කොට රු. 150,000 ක ඉදිකිරීම් සිදු කර ඇත.
- යාවජීව සාමාජික අරමුදලෙන් ආදායම් වියදම් ගිණුමට මාරු කිරීම රු. 30,000 කි.
- 2022.04.01 දින පරිත්‍යාග ලෙස ලද ත්‍රීරෝද රථයෙහි වටිනාකම රු. 500,000 ක් වූ අතර එය වසර 5 ක් තුළ ආදායමෙහි හඳුනා ගැනේ.
- 2023.03.31 දිනෙන් අවසන් කාලපරිච්ඡේදයේ අතිරික්තය රු. 40,000 කි. (ඉහත 1, 2 හා 3 ගැලපීමට පෙර)

2023.03.31 දිනට ක්‍රීඩා සමිතියේ හිමිකම පහත සටහන තුළ දක්වන්න.

| | |
|---|---|
| 2022.04.01 සමුච්චිත අරමුදල | රු…………………………………. |
| අතිරික්තය | රු…………………………………. |
| ගොඩනැගිලි අරමුදල | රු…………………………………. |
| යාවජීව සාමාජික අරමුදල | රු…………………………………. |
| | ………………………………….. |

# REVISION EXERCISE
# Grade 12

01. අමාලි සිල්ලර වෙළෙඳ ව්‍යාපාරයක් පවත්වාගෙන යනු ලබයි. 2023.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා කෙටුම්පත් ආදායම් ප්‍රකාශනයේ රු. 1 000 000 ක ලාභයක් වාර්තා කරන ලදී. 2023.03.31 දිනට කෙටුම්පත් මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ රු. 200 000 ක මුදල් ශේෂයක් පෙන්නුම් කර ඇත. සමන්ත ගිණුම්පොත් නිසිලෙස පවත්වාගෙන නොමැත. පහත ගනුදෙනු ගිණුම් පොත්වල වාර්තාකර නොමැති බව පසුව හෙළිදරව් වේ.

**අංකය ගනුදෙනුව**

1. රු. 50 000 ක් පිරිවැය වූ භාණ්ඩ රු. 80 000 කට ණයට විකිණීම
2. රු. 5 000 ක් පිරිවැය වූ රු. 10 000 කට ණයට විකුණූ භාණ්ඩ ආපසු එවීම
3. 2022.07.01 දින 12% ක වාර්ෂික පොලියට රු. 400 000 ක බැංකු ණයක් ලබා ගැනීම. පොලිය මෙතෙක් ගෙවා නොමැත.
4. 2023.03.31 දින රු. 200 000 ක අත්පිට මුදලට කුඩා මෝටර් රථයක් මිලට ගැනීම
5. ව්‍යාපාරයේ මෙහෙයුම් වියදම් රු. 14 000 ක් විය. මෙයින් රු. 8000 ක් අමාලි විසින් පුද්ගලික මුදලින් ගෙවන ලදී. ඉතිරිය ව්‍යාපාරයේ මුදලින් ගෙවන ලදී.
6. රු. 15 000 ක් අමාලිගේ ජීවිත රක්ෂණ වාරිකය වෙනුවෙන් මුදලින් ගෙවන ලදී.
7. පිරිවැය රු. 20 000 ක භාණ්ඩ පරිත්‍යාග කිරීම.
8. ණයගැතියෙකුගෙන් අයවිය යුතු රු. 50 000 ක් ඔහුට ණයහිමියෙකු ලෙස ගෙවිය යුතු රු. 80 000 කට හිලව්කර ඉතිරිය මුදලින් ගෙවන ලදී.
9. ගණුදෙනු අංක 1 ට අදාළව ලැබිය යුතු මුදලින් 10% ක වට්ටමක් අඩුකිරීමෙන් පසුව මුදල් ලැබීම.
10. පෙර වර්ෂයේ දී කපාහල රු. 10 000 ක මුදලක් ආපසු ලැබීම.

1. මෙම ගනුදෙනුවල බලපෑම (අගයන් සහිතව) ගිණුම්කරණ සමීකරණය භාවිතා කරමින් පෙන්නුම්කර, එක් එක් අගය ඉදිරියෙන් එය වැඩි නම් (+) ද, අඩු නම් (-) ද යන්න සඳහන් කරන්න. (පහත දී ඇති ආකෘතියට සමාන ආකෘතියක් භාවිත කරන්න.)

| ගනුදෙනු අංකය | වත්කම් | | | | වගකීම් | | | හිමිකම |
|---|---|---|---|---|---|---|---|---|
| | දේපළ, පිරියත සහ උපකරණ | තොග | වෙළෙඳ ලැබිය යුතු දෑ | මුදල් | දිගුකාලීන ණය | වෙළෙඳ ගෙවිය යුතු දෑ | වෙනත් ගෙවිය යුතු දෑ | |
| | | | | | | | | |

2. 2023.03.31 දිනට සංශෝධිත මුදල් ශේෂය
3. 2023.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සංශෝධිත ලාභය (හිමිකම මත ගනුදෙනුවල ශුද්ධ බලපෑම පදනම්ව)

02. සීමිත නියෝමාල් ලංකා 2024.01.01 දිනට පිළියෙළ කළ බැංකු ප්‍රකාශනය පහත පරිදි වේ.

**බැංකු සැසඳුම් ප්‍රකාශය** **රු'000**

| | | |
|---|---|---|
| මුදල් පොතට අනුව බැංකු ශේෂය | 400 | |
| + නිකුත් කළ ගෙවීමට ඉදිරිපත් නොවූ චෙක් | 80 | |
| | | 480 |
| - තැන්පත් කළ නමුත් උපලබ්ධි නොවූ චෙක් | | (120) |

| බැංකු ප්‍රකාශනයට අනුව බැංකු ශේෂය | 360 |
|---|---|

පහත අමතර තොරතුරු ඔබට දී ඇත.

1. 2024 ජනවාරි මාසය තුළ රු. 500 000 ක චෙක්පතක් නිකුත්කර ඇති අතර ඒවායින් ජනවාරි මාසය තුළ 380 000 ක චෙක්පත් පමණක් බැංකුවට ඉදිරිපත් වී ඇත.
2. 2024 ජනවාරි මාසය තුළ රු. 600 000 ක චෙක්පත් බැංකුවේ තැන්පත් කර ඇති අතර එයින් 2024.01.31 දින වන විට රු. 440 000 ක චෙක්පත් උපලබ්ධි වී තිබුණි.
3. 2024 ජනවාරි මාසය තුළ මුදල් පොතේ සටහන් නොවූ බැංකු ප්‍රකාශනයෙන් අනාවරණය වූ ගනුදෙනු පහත පරිදි විය.

| | රු'000 | | රු'000 |
|---|---|---|---|
| ණයගැති ප්‍රේෂණ | 40 | තැම්පත් කළ අහරු වූ චෙක් | 30 |
| බැංකු ගාස්තු | 15 | ස්ථාවර නියෝග ගෙවීම් - ණය වාරික | 50 |

4. 2024.01.01 දිනට පැවති උපලබ්ධි නොවූ චෙක්පත් 2024 ජනවාරි මාසය තුළ උපලබ්ධි වූ අතර 2024.01.01 දිනට ඉදිරිපත් නොවූ චෙක්පත් වලින් රු. 50 000 ක චෙක්පත් පමණක් 2024 ජනවාරි මාසය තුළ බැංකුවට ඉදිරිපත් වී ඇත.

**අවශ්‍ය වන්නේ ,**

1. බැංකු ප්‍රකාශනය ලැබීමට පෙර 2024 ජනවාරි මාසය සඳහා පිළියෙළ කළ බැංකු ගිණුම්
2. බැංකු පොත සංශෝධනය කිරීම.
3. 2024.01.31 දිනට බැංකු සැසඳුම් ප්‍රකාශනය

03. සුපුන් තනි පුද්ගල ව්‍යාපාරයක අයිතිකරුවෙකි. පහත දැක්වෙන මූල්‍ය ප්‍රකාශනය එම ව්‍යාපාරයේ අලුත් ගිණුම් සහයක විසින් පිළියෙළ කර ඇත.

**2023.03.31 දිනට මූල්‍ය තත්ව ප්‍රකාශනය**

| | | රු'000 |
|---|---|---|
| දේපළ පිරියත හා උපකරණ | | 800 |
| තොග | 300 | |
| ණයගැතියෝ | 100 | |
| බැංකු හා අතැති මුදල් | 50 | |
| අවිනිශ්චිත ගිණුම | 50 | 500 |
| | | 1300 |
| ප්‍රාග්ධනය | 700 | |
| ශුද්ධ ලාභය | 450 | 1150 |
| ණයහිමියෝ | | 150 |
| | | 1300 |

පහත සඳහන් වැරදි පසුව අනාවරණය විය.

1. රු. 4 800 ක දුන් වට්ටම් ලෙජර් ගිණුම්වල සටහන් කර ඇත්තේ රු. 8 400 ක් ලෙසය.
2. රු. 20 000 ක අත්පිට විකුණුම් විකුණුම් ගිණුමට දෙවරක් බැර කර ඇත.
3. ණයහිමියන්ට ගෙවීම් රු. 20 000 සහ වරිපනම් ගෙවීම් රු. 10 000 මුදල් ගෙවීම් ජ'නලයේ හා මුදල් පාලන ගිණුමේ නිවැරදිව සටහන් කර ඇතත් අදාළ අනිකුත් ගිණුම්වල පිටපත් කර නැත.

**අවශ්‍ය වන්නේ ,**

1. ඉහත වැරදි නිවැරදි කිරීම් සඳහා ජ'නල් සටහන්
2. ශුද්ධ ලාභය නිවැරදි කිරීමේ ප්‍රකාශනයක්
3. වැරදි නිවැරදි කළ පසු 2023.03.31 දිනට මූල්‍ය තත්ව ප්‍රකාශනයක්

04. අසිත සහ ලසිත හවුල් ව්‍යාපාරයේ ආධුනික ගිණුම් ලිපිකරු විසින් 2023.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සකස් කළ ගිණුම් වලින් උපුටා ගැනීම් කිහිපයක් පහත දැක්වේ.

| | | හර (රු.) | බැර (රු.) |
|---|---|---|---|
| **2022.04.01 දිනට ශේෂ** | | | |
| ප්‍රාග්ධන ගිණුම් | - අසිත | - | 350 000 |
| | - ලසිත | - | 250 000 |
| ජංගම ගිණුම් | - අසිත | - | 12 000 |
| | - ලසිත | 8 000 | |
| 2023.03.31 දිනට තොගය | | 80 000 | |
| විසිතගෙන් ගත් ණය | | - | 50 000 |
| විසර්ජනයට පෙර ලාභය | | - | 252 000 |

ලාභය ගණනය කිරීමේ දී පහත දැක්වෙන අඩුපාඩු සිදු වී ඇති බව අභ්‍යන්තර විගණනයේ දී හෙළිදරව් වී ඇත.

1. විසිතගේ ණය සඳහා වාර්ෂික පොලිය රු. 5 000 ක් වාර්තා නොකිරීම.
2. අසිත සහ ලසිත විසින් සිදු කළ ගැනිලි පිළිවෙළින් රු. 10 000 ක් සහ රු. 8 000 ක් වියදම් ලෙස වාර්තා කිරීම
3. 2023.03.31 දිනට තොගය රු. 24 000 කින් අධිගණනය වී තිබීම.
4. 2022.10.01 දින විසිත ඔහු සතු රු. 160 000 වූ ගබඩා ගොඩනැගිල්ලක් ව්‍යාපාරයට යෙදවූ අතර, එදින සිට ම එය වර්ෂයකට රු. 12 000 බැගින් කුලියට දී වර්ෂ 2 ක කුලී ආදායමක් ලබාගෙන ඉන් වර්ෂයකට අදාළ කුලිය ලාභයට ගැලපීම් කර තිබීම.
5. 2022.04.01 දින දේපළ පිරියත හා උපකරණ රු. 100 000 ක් වූ අතර රු. 200 000 වටින් උපකරණ 2022.10.01 දින අත්පත් කර ගෙන ඇත. දේපළ පිරියත හා උපකරණ වාර්ෂිකව පිරිවැය මත 10% බැගින් ක්ෂය කළ යුතු ය.
   සම සමව ලාභාලාභ බෙදා ගනිමින් පවත්වාගෙන ගිය අසිත සහ ලසිත හවුල් ව්‍යාපාරයට 2022.04.01 දින නව හවුල්කරුවෙකු ලෙස විසිත බඳවා ගන්නා ලදී.

පහත දැක්වෙන අතිරේක තොරතුරු ද ඔබට සපයා ඇත.

A- විසිත 2022.04.01 දින ප්‍රාග්ධනය ලෙස රු. 150 000 ක් ගෙන ආ අතර, එදින කීර්තිනාමය රු. 90 000 ක් ලෙස තක්සේරු කර ප්‍රාග්ධන ගිණුමෙන් ගැලපීමට එකඟ විය.
B- විසිතගේ ප්‍රාග්ධනයට 10% වාර්ෂික පොලියක් හිමිවන අතර 2023.03.31 දින තෙක් ඔහුට ප්‍රාග්ධන පොලී ගෙවා නැත.
C- විසිතගේ ණය ගිණුම 2022.03.31 දින සිට ඔහුගේ ප්‍රාග්ධන ගිණුමට මාරු කිරීමට එකඟ විය.
D- 2023.03.31 දිනට අසිත සහ ලසිතගේ ප්‍රාග්ධන පොලී හා වේතන පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | **අසිත (රු.)** | **ලසිත (රු.)** |
|---|---|---|
| ගෙවූ ප්‍රාග්ධන පොලී | 12 000 | 10 000 |
| ගෙවිය යුතු ප්‍රාග්ධන පොලී | 24 000 | 16 000 |
| ගෙවූ වේතන | 30 000 | 20 000 |
| ගෙවිය යුතු වේතන | 15 000 | 15 000 |

**අවශ්‍ය වන්නේ ,**

1. ලාභය නිවැරදි කිරීමේ ජ'නල් සටහන් (සංලක්ෂය අවශ්‍ය නොවේ.)
2. 2023.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ලාභාලාභ විසර්ජනය කර ගන්නා ආකාරය
3. 2023.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා හවුල් කරුවන්ගේ ජංගම ගිණුම් හා ප්‍රාග්ධන ගිණුම්

05. 2023.03.01 දිනට මෙහෙයුම් කටයුතු ආරම්භකරන ලද නෙස්වලේ මාගරින් ව්‍යාපරයේ පහත තොරතුරු ඔබට දී ඇත.

ණයගැති ලෙජරයේ සාරාංශය

**(සියලු වටිනාකම් රු.'000 වලිනි)**

| ණයගැතියා | විකුණුම් | දුන් වට්ටම් | මුදල් ලැබීම් | 2023.03.31 දිනට ශේෂය |
|---|---|---|---|---|
| ආමිලා | 2 000 | 200 | 1 400 | 400 |
| කමන්ති | 1 000 | 100 | 700 | 200 |
| දුෂ්මාන් | 500 | - | - | 500 |
| එකතුව | 3 500 | 300 | 2 100 | 1 100 |

ණයහිමි ලෙජරයේ සාරාංශය

(සියලු වටිනාකම් රු.'000 වලිනි)

| ණය හිමියා | ගැනුම් | ලද වට්ටම් | මුදල් ගෙවීම් | 2023.03.31 දිනට ශේෂය |
|---|---|---|---|---|
| වමීෂ | 1 400 | 100 | 700 | 600 |
| නදීෂ | 800 | 50 | 250 | 500 |
| අනුෂ | 480 | - | - | 480 |
| එකතුව | 2 680 | 150 | 950 | 1 580 |

**අතිරේක තොරතුරු :**

1. 2023.03.31 දිනට ණයගැති ලෙජරයේ සහ ණයහිමි ලෙජරයේ ශේෂවල එකතුන් එදිනට පාලන ගිණුම්වල ශේෂ සමග එකඟ නොවීය. පසුව කරන ලද විමර්ෂණයේ දී පහත වැරදි අනාවරණය විය.
   - i විකුණුම් ජ'නලයේ එකතුව ණයගැති පාලන ගිණුමට හා විකුණුම් ගිණුමට පිටපත් කර ඇත්තේ, රු. 350 000 ක් ලෙසයි.
   - ii ණයගැතියන්ට දුන් වට්ටම් ණයගැති පාලන ගිණුමට හර කර ඇත. නමුත් එය නිවැරදිව දුන් වට්ටම් ගිණුමේ පිටපත් කර ඇත.
   - iii ගැනුම් ජ'නලයේ එකතුව ණය හිමි පාලන ගිණුමට හා ගැනුම් ගිණුමට පිටපත් කර ඇත්තේ රු. 6 280 000 ක් ලෙසය.
   - iv අනුෂට ආපසු යැවුම් රු. 30 000 ක් ණයහිමි ලෙජරයේ ඇයගේ ගිණුමේ සටහන් කර නැත. එය පොදු ලෙජරයේ ණයහිමි පාලන ගිණුමට හර කර විකුණුම් ගිණුමට බැර කර ඇත.
2. 2023.03.31 දිනෙන් අවසන් මාසය සඳහා (ඉහත වැරදි නිවැරදි කිරීමට පෙර) ව්‍යාපාරයේ කෙටුම්පත් ආදායම් ප්‍රකාශනයේ වාර්තා කළ අලාභය රු. 4 000 000 කි.

**අවශ්‍ය වන්නේ,**

1. ඉහත වැරදි නිවැරදි කිරීම සඳහා ජ'නල් සටහන්
2. 2023.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සංශෝධිත ලාභය හෝ අලාභය
3. ඉහත වැරදි නිවැරදි කිරීමට පෙර 2023 මාර්තු මාසය සඳහා ණයගැති පාලන ගිණුම
4. ඉහත වැරදි නිවැරදි කිරීමෙන් පසු 2023 මාර්තු මාසය සඳහා ණයහිමි පාලන ගිණුම

06. සුනිමල් 2023.03.01 දින රු. 400 000 ක් මුදල් ආයෝජනය කරමින් පියාගේ කර්මාන්ත හා වෙළෙඳ භූමිය තුළම කුඩා කොටසක වාහන අමතර කොටස් අලෙවිකරන ව්‍යාපාරයක් ආරම්භ කරන ලදී. තව ද රු. 600 000 ක් වටිනා කුඩා ලොරියක් එදිනම මිලදී ගන්නා ලදී. ඔහු ව්‍යාපාරය නමින් බැංකු ගිණුමක් ආරම්භ කරන ලද අතර සියලුම මුදල් ගනුදෙනු එම ගිණුම තුළින් සිදුකරන ලදී. පළමු මෙහෙයුම් මාසය තුළ පහත ගනුදෙනු සිදුවිය.

| ගනුදෙනු අංකය | ගනුදෙනු |
|---|---|
| 1. | රු. 200 000 ක අමතර කොටස් අත්පිට මුදලට මිලදී ගන්නා ලදී. |
| 2. | රු. 120 000 ක් වූ පිරිවැය වූ අමතර කොටස් 200 000 කට අත්පිට මුදලට විකුණන ලදී. |
| 3. | රු. 300 000 ක අමතර කොටස් ණයට ගන්නා ලදී. |
| 4. | රු. 50 000 ක තොග යල් පැණුනු අමතර කොටස් නිසා ආපසු යවන ලදී. |
| 5. | 2021.03.15 දින රු. 300 000 ක පරිගණකයක් ණයට ගන්නා ලදී. එම මුදල මාසික වාරික 15 කින් ගෙවිය යුතු වේ. |
| 6. | රු. 150 000 අමතර කොටස් රු. 300 000 කට ණයට විකුණන ලදී. |
| 7. | රු. 30 000 ක අලෙවි විධායකගේ වැටුප මුදලින් ගෙවන ලදී. |
| 8. | අමන්තගේ පෞද්ගලික භාවිතයට රු. 40 000 ක මුදලක් ව්‍යාපාරයෙන් ලබා ගන්නා ලදී. |
| 9. | ගෙවිය යුතු ශේෂය මත 10% ක වට්ටමකට යටත්ව අමතර කොටස් සැපයුම්කරුවන්ට ගෙවිය යුතු මුදල ගෙවන ලදී. |

10. 10% ක වට්ටමක් අඩු කිරීමෙන් පසුව ණයගැතියන්ගෙන් ලැබිය යුතු මුදල ලබා ගන්නා ලදී.

**අතිරේක තොරතුරු :**

2023 මාර්තු මාසය සඳහා රු. 6 000 ක වරිපනම් බිල 2023.04.12 දින ලැබුණි.
ව්‍යාපාරයේ දේපළ පිරියත උපකරණ වාර්ෂිකව 12% බැගින් සරල මාර්ග ක්‍රමයට ක්ෂය කළ යුතු වේ.

**අවශ්‍ය වන්නේ,**

1. ඉහත 01 සිට 10 දක්වා ගනුදෙනුවල බලපෑම (අගයන් සහිතව) ගිණුම්කරණ සමීකරණය භාවිත කරමින් පෙන්නුම් කර, එක් එක් අගය ඉදිරියෙන් එය වැඩි වේ නම් (+) ද, අඩු නම් (-) ද සඳහන් කිරීම.
2. 2023.03.31 දිනෙන් අවසන් මාසය සඳහා ව්‍යාපාරයේ ආදායම් ප්‍රකාශනය

| | | | |
|---|---|---|---|
| ආරම්භක ප්‍රාග්ධනය | | | ............ |
| කාලච්ඡේදය | + | ලාභය | |
| | - | අලාභය | |
| - ගැනිලි | | | ______ |
| 2023.03.31 දිනට හිමිකම | | | ====== |

3. පහත ආකෘතිය භාවිත කරමින් 2023.03.31 දිනට ව්‍යාපාරයේ හිමිකමේ සංයුතිය

07. අමල් හා කමල් පිළිවෙළින් 3 : 2 අනුපාතයට ලාභලාභ බෙදා ගනිමින් පවත්වාගෙන යන හවුල් ව්‍යාපාරයට 2022.04.01 දින විමල් හවුල්කරුවෙකු ලෙස බඳවා ගන්නා ලදී. මෙය නිමිති කරගෙන කීර්තිනාමය රු. 60 000 කට අගය කරන ලද අතර, විමල් තම ප්‍රාග්ධනය හා කීර්තිනාමය කොටස් වශයෙන් ගෙන එන ලද රු. 100 000 ක් වටිනා පරිගණක හා උපාංග සහ රු. 50 0000 ක මුදල, විමල්ගේ නමින් ගිණුමකට බැර කර ඇත.

එදින ඔවුන් කොන්දේසි වලට එකඟ විය.

1. හවුල්කරුවන්ගේ ගැලපූ ප්‍රාග්ධන ශේෂ මත 10% වාර්ෂික පොලියක් ගෙවීම.
2. අමල්, කමල් හා විමල් පිළිවෙලින් 3 : 2: 1 අනුපාතයට ලාභාලාභ බදා ගැනීම.
3. අමල් හා විමල් තම සේවය වෙනුවෙන් මසකට රු. 10 000 බැගින් වේතන ගෙවීම.
4. කීර්තිනාමය ප්‍රාග්ධන ගිණුම මගින් ගැලපීම.

අමල්, කමල් හා විමල් හවුල් ව්‍යාපාරයේ පොත් තබන්නා විසින් 2023.03.31 දිනට පිළියෙළ කළ ශේෂ පිරික්සුම පහත දැක් වේ.

**අමල්, කමල් හා විමල් හවුල් ව්‍යාපාරය**
**2023.03.31 දිනට ශේෂ පිරික්සුම**

| | | හර | බැර |
|---|---|---|---|
| වෙනත් | | 216 | |
| ගොඩනැගිලි කුලී | | 51 | |
| බෙදාහැරීමේ වියදම් | | 169 | |
| ජංගම වත්කම් | | 214 | |
| දේපළ පිරියත හා උපකරණ | | 650 | |
| දේපළ පිරියත උපකරණ සමුච්චිත ක්ෂය (2022.04.01 ට) | | | 50 |
| දළ ලාභය | | | 480 |
| ණය ගිණුම | - කමල් | | 100 |
| 2022.04.01 ට ප්‍රාග්ධන ගිණුම | - අමල් | | 210 |
| | - කමල් | | 176 |
| 2022.04.01 ට ජංගම ගිණුම | - අමල් | | 40 |
| | - කමල් | | 25 |
| විමල්ගේ ගිණුම | | | 150 |
| ජංගම වගකීම් | | | 65 |

| | | |
|---|---|---|
| | 1 300 | 1 300 |

**අතිරේක තොරතුරු :**

1. දේපළ පිරියත උපකරණ සරල මාර්ග ක්‍රමයට වාර්ෂිකව 10% ක් ක්ෂය කරයි.
2. අමල් හා විමල් මුල් මාස හය සඳහා වේතන ලබාගෙන ඇති අතර, එය වේතන ගිණුමේ ඇතුළත් වේ.
3. අමල්, කමල් හා විමල් ගිණුම් කාලච්ඡේදය තුළ භාණ්ඩ ගැනිලි කර ඇත. එහි පිරිවැය පිළිවෙළින් රු. 10 000 රු. 5 000 හා රු. 5 000 ක් වේ. මේ පිළිබඳ කිසිඳු සටහනක් තබා නැත.
4. ව්‍යාපාර ගොඩනැගිල්ල මසකට රු. 5 000 බැගින් කුලියට ගෙන ඇත. 2022.10.01 සිට මසකට රු. 7 000 බැගින් ගෙවීමට ගිවිසගෙන ඇති අතර අවසන් මාස 03 සඳහා කුලිය ගෙවීමට ඇත.
5. අමල් වෙනත් ව්‍යාපාරයකින් මිලට ගත් උපකරණ තොගයක් ඔහුගේ නිවසට ප්‍රවාහනය කිරීමේ වියදම රු. 3 000 ක් බෙදා හැරීමේ වියදම් තුළ ඇතුළත් වේ.

**අවශ්‍ය වන්නේ,**

1. අමල්, කමල් හා විමල් හවුල් ව්‍යාපාරයේ 2023.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ලාභ හෝ අලාභ ප්‍රකාශන (විසර්ජන ද ඇතුළුව)
2. 2023.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා හවුල්කරුවන්ගේ ප්‍රාග්ධන ගිණුම් (අනුතීරු ක්‍රමයට)
3. 2023.03.31 දිනෙන් අවසන් වර්ෂයේ ජංගම ගිණුම් (අනුතීරු ක්‍රමයට)
4. 2023.03.31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය

08. නිමල් සමාගමේ ණයගැතියන් මත හානිකරණ අලාභ වෙන් කිරීමේ ගිණුමේ ශේෂය 2022.04.01 දිනට පහත ලෙස සැකසී තිබුණි.

| | | |
|---|---|---|
| විශ්ව | 100% | 40 000 |
| කමල් | 100% | 32 000 |
| අරුණ | 50% | 16 000 |
| අනිකුත් | 5% | 8 000 |
| ණයගැතියන්ගේ පොදු වෙන් කිරීම | | |
| | | 96 000 |

2022/2023 වසර තුළ දී පහත ගනුදෙනු සිදුවිය.

1. මුළු ණයට විකුණුම් රු. 7 000 000
2. අත්පිය විකුණුම් මුදල රු. 1 200 000
3. ණයගැතියන්ගෙන් එකතු කරගත් මුදල 6 100 000
4. වසර තුළ කපාහළ බොල් ණය
   විශ්ව 40 000
   මානෙල් 15 000

2023 මාර්තු 31 දිනට ණයගැතියන් මත හානිකරණ අලාභ පහත පරිදි විය යුතු බවට තීරණය කරන ලදී.

කමල් නමැති ණයගැතියාගෙන් 100% ක් ද
ලංකා නමැති ණයගැතියාගෙන් 100% ක් ද
සම්පත් නමැති ණයගැතියාගෙන් 50% ක් ද
ඉතිරි ණයගැතියන්ගෙන් 5% ක් ද වෙන් කිරීමට තීරණය කරන ලදී.

2023 මාර්තු 31 දිනට ණයගැති ශේෂය පහත පරිදි සමන්විත විය.

| | | | |
|---|---|---|---|
| කමල් | - 32 000 | ලංකා | - 20 000 |
| සම්පත් | - 10 000 | ඉතිරි ණයගැතියෝ | ? |

**අවශ්‍ය වන්නේ,**

1. 2022/2023 වසර සඳහා ණයගැති පාලන ගිණුම සහ ණයගැතියන් මත හානිකරණ අලාණයගැතියන් මත හානිකරණ අලාභ වෙන් කිරීමේ ගිණුම
2. 2022/2023 වසර සඳහා බොල්ණය ගිණුම
3. 2023 මාර්තු 31 දිනට මූල්‍ය තත්ව ප්‍රකාශනයේ පෙන්විය යුතු ණයගැතියන්ට අදාළ තොරතුරු

09. සී/ස අමරසිරි සමාගමේ මුදල් පාලන ගිණුමේ ශේෂය රු. 6 000 ක් 2023.03.31 දිනට පෙන්වනු ලැබුව ද එම අගය එදිනට බැංකු විස්තරයේ ශේෂයට සම නොවීය. එදිනට බැංකු විස්තරයේ ශේෂය රු. 8 800 කි. ව්‍යාපාරයේ ගිණුම් ලිපිකරු පහත කරුණු වෙනසට බලපෑ ඇති බව සොයාගෙන ඇත.

1. මුදල් පාලන ගිණුමේ බැර වී තිබූ රු. 6 000 ක චෙක්පතක් බැංකු විස්තරයේ සඳහන් ව නැත.
2. රු. 7 000 ක චෙක්පතක් මුදල් පාලන ගිණුමට හර කර තිබුණ ද බැංකු විස්තරයේ එම අගය සටහන් වී නැත.
3. ස්ථාවර තැම්පතුවලට අදාළ පොලිය රු. 1 200 ක් බැංකු විසින් 2023.03.24 දින ජංගම ගිණුමට මාරුකර ඇතත්, ව්‍යාපාරය විසින් එය මුදල් පාලන ගිණුමට 2023.04.04 දින බැර කර ඇත.
4. මුදල් පාලන ගිණුමේ ගෙවීම් පැත්තේ රු. 400 ක් අඩුවෙන් එකතු කර තිබුණි.
5. ලද ලාභාංශ රු. 3 000 ක් බැංකු විසින් රැස්කර තිබුණ ද එය මුදල් පාලන ගිණුමේ සටහන් කර නොතිබිණි.
6. බැංකුව අයකළ බැංකු ගාස්තු රු. 600 ක් බැංකු විස්තරයේ සඳහන් ව තිබුණි.
7. ඉතිරිකිරීමේ ගිණුමේ ලබාගත් රු. 1 200 ක මුදලක් වැරදීමෙන් ජංගම ගිණුමට බැර කර ඇත.
8. රු. 600 ක කල් ඉකුත් වූ චෙක්පතක් වෙනුවට නව චෙක්පතක් විල්සන්ට න්කුත් කර ඇත. මෙම චෙක්පත් දෙකම නිකුත් කළ එහෙත් බැංකුවට ඉදිරිපත් නොවූ චෙක්වල ඇතුළත්ව ඇත.

**ඉහත තොරතුරු ඇසුරෙන්**

1. සංශෝධිත මුදල් පාලන ගිණුම පිළියල කරන්න.
2. 2023 මාර්තු සඳහා බැංකු සැසඳුම් ප්‍රකාශ

10. Super Star එක්සත් ක්‍රීඩා සමාජයේ 2023.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා පහත ලැබීම් ගෙවීම් ගිණුම ඔබට දී ඇත.

| | | | |
|---|---|---|---|
| ඉ/ගෙ ශේෂය | 153 | ක්‍රීඩාංගනය සකස් කිරීමේ වියදම් | 12 |
| යාවජීව සාමාජික ගාස්තු | 40 | ආහාර පාන වියදම් | 18 |
| වාර්ෂික සාමාජික ගාස්තුව | 27 | කුලී ගෙවීම් | 34 |
| ක්‍රීඩාංගන කුලී ලැබීම් | 53 | දුරකථන ගාස්තු | 9 |
| ආපන ශාලාවේ ආදායම | 74 | සේවක වැටුප් | 80 |
| | | ප/ගෙ/ ශේෂය | 194 |
| | 347 | | 347 |

**පහත අමතර තොරතුරු ඔබට දී ඇත.**

1. වසර තුළ දී කුඩා සමාජයට යාවජීව සාමාජික ක්‍රමය හඳුන්වා දී ඇත. යාවජීව සාමාජික ගාස්තු සම්බන්ධව ක්‍රීඩා සමාජයේ ප්‍රතිපත්තිය වන්නේ, සාමාජිකත්වය ප්‍රධානය කළ වසරේ සිට වසර 10 ක කාලසීමාවක් තුළ කපාහැරීමයි.
2. සාමාජිකයෙකුගේ වාර්ෂික සාමාජික ගාස්තුව රු. 400 ක් වන අතර යාවජීව සාමාජික ගාස්තුව රු. 4 000 කි.
3. ක්‍රීඩා සමිතියේ සාමාජිකයන් 80 දෙනෙකු ඇති අතර ඔවුන්ගෙන් 10 දෙනෙකු යාවජීව සාමාජිකයන් වේ.
4. වසර තුළ ලද සාමාජික මුදල තුළ 2022 වර්ෂයේ හිඟ සාමාජික මුදල් රු. 11 000 ක් ද 2023 සඳහා කලින් ලද සාමාජික මුදල් රු. 7 000 කි.
5. ක්‍රීඩා සමාජය සතු ක්‍රීඩාංගණය පිටස්තර ආයතනවල ක්‍රීඩා උත්සව සඳහා කුලියට දෙනු ලැබේ. කෙසේ නමුත් ක්‍රීඩාංගනය සකස් කිරීමේ වියදම ක්‍රීඩා සමාජය විසින් දැරිය යුතු වේ.
6. ක්‍රීඩා සමාජයේ සේවකයන් තුන්දෙනෙකුට ගෙවූ වාර්ෂික වැටුප් විස්තරය

| | | |
|---|---|---|
| ආපනශාලා සේවකයාට | - | 10 000 |
| ලිපිකරු | - | 30 000 |
| ක්‍රීඩාංගන භාරකරුට | - | 40 000 |

7. 2023.01.01 දිනට හා 2023.12.31 දිනට අදාළ වන ශේෂ කිහිපයක් පහත දැක්වේ.

| | **2023.01.01** | **2020.12.31** |
|---|---|---|
| ආහාර තොග | 12 000 | 21 000 |
| ලී බඩු හා උපකරණ (ශුද්ධ අගයට) | 42 000 | 38 000 |

**අවශ්‍ය වන්නේ, 2023 වර්ෂය සඳහා**

1. සාමාජික ගාස්තු ගිණුම
2. යාවජීව සාමාජික ගාස්තු ගිණුම
3. ආපන ශාලා වෙළෙඳ ගිණුම
4. ආදායම් හා වියදම් ගිණුම
5. 2023.12.31 දිනට මූල්‍ය තත්ව ප්‍රකාශනය

11. රයන්, බ්‍රයන් සහ අයිවන් පහත එකඟතා යටතේ හවුල් ව්‍යාපාරයක් පවත්වා ගෙන ගියහ.

- ආරම්භක ප්‍රාග්ධනය මත 10% ක වාර්ෂික පොලියක් සෑම හවුල්කරුවෙකුටම අයත් වේ.
- මසකට හවුල් වේතන පිළිවෙළින්, රයන් රු. 5 000, බ්‍රයන් රු. 3 000 අයිවන් රු. 2 000
- රයන්, බ්‍රයන් සහ අයිවන් අතර 3 : 2 : 1 අනුපාතයට ලාභ බෙදා ගනී.

2023.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා හවුල් ව්‍යාපාරයේ, කෙටුම්පත් ආදායම් ප්‍රකාශනයට අනුව හවුල්කරුවන්ට බෙදාහැරීමට පෙර ලාභය රු. 485 000 ක් විය. අභ්‍යන්තර ගිණුම් පරීක්ෂාවේ දී කෙටුම්පත් ලාභයට හේතු වූ කරුණු වැරදි කිහිපයක් යටතේ හඳුනාගෙන ඇත.

1. රයන්ගේ රු. 100 000 ක් ද, බ්‍රයන්ගේ රු. 200 000 ක් ද වූ වාර්ෂික ජීවිත රක්ෂණ වාරිකයන් ව්‍යාපාරය විසින් ගෙවූ නිසා ව්‍යාපාරයේ රක්ෂණ වියදම් ලෙස වාර්තා කර ඇත.
2. සෑම හවුල්කරුවෙකුටම පළමු මාස 6 සඳහා මුදලින් ගෙවූ වැටුප් ව්‍යාපාරයේ වියදමක් ලෙස වාර්තා කර ඇත.
3. ප්‍රාග්ධනයට අතිරේකව රයන් ලබාදුන් රු. 600 000 කට අදාළ මාස 6 ක ණයපොලිය ව්‍යාපාරයේ වියදමක් ලෙස පොත්වල ගලපා නොමැත. ( හවුල් ගිවිසුමේ ණය පොලී කිසිඳු සඳහනක් නොමැත.)

2023.03.31 දින අයිවන් හවුල් ව්‍යාපාරයෙන් විශ්‍රාම ගන්නා ලදී. එදිනම කාමන් මුදලින් රු. 400 000 ක ප්‍රාග්ධනයක් සහිතව හවුලට සම්බන්ධ විය. මෙම හිමිකමේ වෙනසට අනුරූපිව කීර්තිනාමය රු. 1 200 000 කට ඇස්තමේන්තු කර ඇත. කීර්තිනාම ගිණුමක් පොත්වල පවත්වා නොගන්නා අතර අදාළ ගැලපුම් හවුල්කරුවන්ගේ ප්‍රාග්ධන ගිණුම් මගින් කළ යුතු වේ. අයිවන්ට ගෙවිය යුතු මුදල හවුල් ව්‍යාපාරයේ ණයක් ලෙස රඳවාගනී. නව හවුල ලාභාලාභ සමාගම බෙදාගැනීමට එකඟ විය.

2022.04.01 දිනට හවුල්කරුවන්ගේ හිමිකම පහත පරිදි විය.

**(රු‘000)**

| | **රයන්** | **බ්‍රයන්** | **අයිවන්** |
|---|---|---|---|
| මුළු හිමිකම | 550 | 380 | 220 |
| ප්‍රාග්ධන ගිණුම | 500 | 400 | 200 |

**අවශ්‍ය වන්නේ,**

1. සංලක්ෂ්‍ය සමග වැරදි නිවැරදි කිරීමට ජ’නල් සටහන්
2. 2023.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා හවුල් ව්‍යාපාරයේ නිවැරදි ලාභය දක්වන ප්‍රකාශනයක්.
3. 2023.03.31 දිනට හවුල්කරුවන්ගේ ප්‍රාග්ධන ගිණුම් හා ජංගම ගිණුම්

12. සී/ස පිදුරංගල සමාගමේ 2023.12.31 දිනට මුදල් පාලන ගිණුමේ බැර ශේෂය රු. 193 000 ක් පෙන්වන අතර එය අදාළ මාසයේ බැංකු විස්තර සමග සමාන නොවීය. සමාගමේ ගිණුම් ලිපිකාරිණිය ශේෂ අසමානතාවයට පහත හේතූන් ඉදිරිපත් කර ඇත.

1. මුදල් පාලන ගිණුමේ හර ලෙස සටහන් කළ ද බැංකු විස්තරයේ සටහන් වී නොතිබුණු චෙක්පත්වල වටිනාකම රු. 48 000 කි.
2. මුදල් පාලන ගිණුමේ බැර කර තිබුණ ද බැංකු විස්තරයේ සටහන් වී නොතිබුණු චෙක්පත්වල වටිනාකම රු. 80 000 කි.
3. මුදල් පාලන ගිණුමේ හර පැත්ත රු. 12 000 ක් අඩුවෙන් එකතු කර ඇත.
4. ව්‍යාපාරය වෙනුවෙන් බැංකු ජංගම ගිණුම රැස්කළ ලාභාංශ ආදායම් රු. 21 000 ක් මුදල් පාලන ගිණුමේ සටහන් වී නොතිබුණි.
5. බැංකුව විසින් එම මාසයේ අයකළ රු. 8 000 ක බැංකු ගාස්තු ස්ථාවර නායෝග ගෙවීම් රක්ෂණ ගාස්තු රු. 12 000 ණයගැති ප්‍රේෂණ 53 000 ක් මුදල් පාලන ගිණුමේ සටහන් වී නොමැත.

**අවශ්‍ය වන්නේ,**

1. මූල්‍යතත්ව ප්‍රකාශනයේ පෙන්විය යුතු සංශෝධිත මුදල් පාලන ගිණුමේ ශේෂය සොයන්න.
2. 2023.12.31 දිනට බැංකු සැසඳුම් ප්‍රකාශනය පිළියෙළ කරන්න.

13. මැදිරිගිරිය මධ්‍ය මහා විද්‍යාලය 2021.04.01 ආදි ශිෂ්‍යයන්ගේ සංගමයක් ස්ථාපිත කරන ලද අතර එම ආරම්භක සාමාජිකයන් රු. 700 000 දායක වෙමින් යාවජීව සාමාජිකත්වය ලබාගන්නා ලදී. පහත ශේෂයන් ආසන්න වර්ෂවල ඔබට ඉදිරිපත් කර ඇත.

| | රු '000 2022.03.31 | 2023.03.31 |
|---|---|---|
| ලැබිය යුතු සාමාජික මුදල් | 150 | 200 |
| කලින් ලද සාමාජික මුදල් | 250 | 300 |
| සමුච්චිත අරමුදල | 2 970 | - |
| | | |
| යාවජීව සාමාජික මුදල් | 630 | 24 |
| ටිෂර්ට් තොගය - පිරිවැය | - | ? |
| සංගීත ප්‍රසංගයේ ලැබිය යුතු වටිනාකම | - | ? |
| මුදල් | 700 | ? |

**අතිරේක තොරතුරු :**

1. සාමාජික මුදල් වාර්ෂිකව රු. 500 අයකරන අතර යාවජීව සාමාජිකයන් හැර 2023.03.31 දිනටසාමාජිකයන් 600 කි විය.
2. යාවජීව සාමාජිකත්වය වර්ෂ 10 ඇතුළත ආදායම් ලෙස හඳුනාගැනීම.
3. සංගමය පවත්වන ලද සංගීත ප්‍රසංගයේ පහත තොරතුරු ඔබට සපයා ඇත.
    1. රු. 1 000 බැගින් විකුණන ලද ප්‍රවේශ පත්‍ර 100
    2. රු. 500 බැගින් විකුණන ලද ප්‍රවේශ පත්‍ර 400 (මින් 80% ලැබී ඇත.)
    3. සංගීත ප්‍රසංගයේ අනුග්‍රාහකයන්ගෙන් 75% ක මුදල එකතු කොට ඇත.එය රු. 750 000 කි.
    4. ගායකයන් 5 දෙනෙකුට ගෙවූ අතර එක් පුද්ගලයෙකුට රු. 50 000
    5. සංගීත කණ්ඩායමට රු. 120 000
       ශාලා කුලී රු. 60 000
       වෙනත් කුලී රු. 40 000
       කාලච්ඡේදය තුළ යාවජීව සාමාජික මුදල් ලෙස රු. 200 000 ලැබී ඇත.
    6. සංගමය විසින් එකක් රු. 400 බැගින් ටිෂර්ට් 660 අත්පිට මුදලට මිලදී ගත් අතර ඉන් එකක් රු. 700 බැගින් 2022.03.31 දිනට සිට සියලු සාමාන්‍ය සාමාජිකයන් අත්පිට මුදලට විකුණන ලදී.
    7. පරිපාලන වියදම් රු. 80 000 ක් අතර ඒ තුළ සේවක වැටුප් රු. 60 000 අන්තර්ගත වේ. 2023 මාර්තු මාසයේ වැටුප රු. 10 000 කි. එය තවම ගෙවා නැත.
    8. කාර්යාල උපකරණ ධාරණ අගය මත 5% ක්ෂය කළ යුතු ය.

**පහත දෑ පිළියෙළ කරන්න.**

1. 2023.03.31 න් අවසන් වර්ෂය සඳහා මුදල් ගිණුම
2. 2023.03.31 න් අවසන් වර්ෂය සඳහා ආදායම් ගිණුම
    1. සාමාජික මුදල් ගිණුම
    2. සංගීත ප්‍රසංගයේ ලාභය/ අලාභය
    3. ටී ෂර්ට් අලෙවියේ ලාභය හෝ අලාභය

14. සීමිත බෙල්ජියම් පොදු සමාගමේ 2023.03.31 දිනට ණයගැති ශේෂ ලේඛනය පහත පරිදි වේ.

| | (රු.'000) |
|---|---|
| ජයන්ත ධර්මරත්න | 800 |
| අයන්ති දිසානායක | 750 |
| මාධව මාලිංග | 700 |
| නීලංග අභයදීර | 850 |
| | 3 100 |

2023 මාර්තු මාසය සඳහා පිළියෙළ කළ ණයගැති පාලන ගිණුම පහත පරිදි විය.

**ණයගැති පාලන ගිණුම රු.'000**

| | | | |
|---|---|---|---|
| 3/1 ඉ/ගෙ/ ශේෂය | 4 000 | ආපසු එවුම් | 2 400 |
| විකුණුම් | 18 000 | මුදල් | 15 000 |
| බොල් ණය | 200 | දුන් වට්ටම් | 300 |
| | | 3/31 ප/ගෙ/ ශේෂය | 4 500 |
| | 22 200 | | 22 200 |

2023.03.31 දිනට ණයගැති ශේෂ ලේඛණයේ එකතුව ණයගැති පාලන ගිණුමේ ශේෂය සමග සමාන නොවීමට හේතු වූ කරුණු පහත පරිදි වේ.

1. විකුණුම් ජ'නලයේ නිවැරදි එකතුව රු. 20 000 කි. නමුත් එය පොදු ලෙජරය තුළ වරදවා පිටපත් කර ඇත.
2. බොල් ණය කපා හැරීම ණයගැති පාලන ගිණුමට හර කර බොල්ණය ගිණුමට බැරකර ඇත.
3. 2023 මාර්තු මාසය සඳහා මුදල් පොතේ දුන් වට්ටම් තීරුවේ එකතුව රු. 400 ක් වන අතර එය පොදු ලෙජරයේ දුන් වට්ටම් ගිණුමේ නිවැරදිව පිටපත් කර ණයගැති පාලන ගිණුමේ වැරදි අගයක් සටහන් කර ඇත.
4. මාධව මාලිංගගෙන් ලද රු. 300 ක මුදල ණයගැති ලෙජරයේ ඔහුගේ පෞද්ගලික ගිණුමට හර කර ඇත.
5. අයන්ති දිසානායකගේ රු. 500 ක ආපසු එවුම් ණයගැති ලෙජරයේ සටහන් කර නැත.
6. ජයන්ත ධර්මරත්නට ණයට විකුණුම් රු. 4000 ක් ණයගැති උප ලෙජරයේ ධර්මරත්නගේ ගිණුමේ සටහන්ව නැත.

**අවශ්‍ය වන්නේ ,**

1. ඉහත වැරදි වලින් 1,2 සහ 3 යන වැරදි නිවැරදි කිරීමට ජ'නල් සටහන්
2. ඉහත වැරදි නිවැරදි කිරීමෙන් පසු 2020 මාර්තු මාසය සඳහා සංශෝධිත ණයගැති පාලන ගිණුම
3. ඉහත වැරදි නිවැරදි කිරීමෙන් පසු නිවැරදි ලාභය (කෙටුම්පත් ශුද්ධ ලාභය රු. 1,140,000)
4. ණයගැති ශේෂ ලැයිස්තුවේ නිවැරදි ශේෂය

15. අචිනි, රුචිනි, සසංකා පහත එකඟතාවයන් යටතේ හවුල් ව්‍යායාපාරයක් පවත්වාගෙන ගියහ.

- ආරම්භක ප්‍රාග්ධනය ශේෂ මත 10% න වාර්ෂික පොලියක් සෑම හවුල්කරුවෙකුම හිමිකම් ලබයි.
- අචිනි, රුචිනි සහ සසංකා පිළිවෙළින් 5 : 3 : 2 අනුපාතයට ලාභ බෙදා ගනී.
- සෑම හවුල්කාරියකටම මසකට රු. 10 000 ක හවුල් වේතනයක් ලබයි.

2023.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා හවුල් ව්‍යාපාරයේ කෙටුම්පත් ආදායම් ප්‍රකාශනයට අනුව,

හවුල්කරුවන්ට ලාභය බෙදා හැරීමට බෙර ශුද්ධ ලාභය රු. 1 850 000 ක් විය. කෙසේ වුවද ව්‍යාපාරයේ ගිණුම් වාර්තා වල පහත වැරදි පසුව හෙළිදරව් වේ.

1. රු. 210 000 ක් වූ සසංකාගේ පෞද්ගලික ජීවිත රක්ෂණ වාරිකය ව්‍යාපාරය විසින් ගෙවා එය ව්‍යාපාරයේ රක්ෂණ වියදමක් ලෙස සටහන් කර ඇත.
2. හවුල් ව්‍යාපාරය බැංකු ණය මත ගෙවූ පොලිය රු. 200 000 ක් පොලී ආදායම් ගිණුමට රු. 20 000 ක් ලෙස බැර කර ඇත.
3. සේවක වැටුප් 470 000 ක් වැටුප් ගිණුමට රු. 740 000 ක් ලෙස හර කර ඇත.
4. 2023.04.01 දින රු. 500 000 ක වටිනාකමකට මිලදී ගත් මෝටර් රථයක් මෝටර් රථ නඩත්තු වියදම් ලෙස සටහන් කර ඇත.
   (මෝටර් රථ වාර්සිකව 10% බැගින් සරල මාර්ග ක්‍රමයට ක්ෂය කරනු ලැබේ.)

2023.03.31 දින අවිනි හවුල් ව්‍යාපාරයෙන් විශ්‍රම ගන්නා ලදී. මෙදින හවුල් ව්‍යාපාරයේ කීර්තිනාමය රු. 1000 000 ක් ලෙස ඇස්තමේන්තු කරන ලදී. කීර්තිනාම ගිණුමක් පොත්වල පවත්වානොගන්නා අතර සියලුම ගැලපුම් හවුල්කරුවන්ගේ ප්‍රාග්ධන ගිණුම තුළින් සිදුකරනු ලැබේ. අවිනිට ගෙවිය යුතු මුදල හවුල් ව්‍යාපාරයේ ණයක් ලෙස පවත්වා ගැනීමටත් රුවිනි හා සසංකා හවුල අඛණ්ඩව පවත්වාගැනීමටත් තීරණය විය. රුවිනි හා සසංකා අතර නව ලාභ අනුපාතය 3 : 2 වේ.

2022.04.01 දිනට හවුල්කරුවන්ගේ ප්‍රාග්ධනය හා ජංගම ගිණුම් බැර ශේෂ පහත පරිදි වේ.

| | **ප්‍රාග්ධන ගිණුම් රු'000** | **ජංගම ගිණුම් රු'000** |
|---|---|---|
| අවිනි | 5 400 | 600 |
| රුවිනි | 4 200 | 400 |
| සසංකා | 2 400 | 300 |

**අවශ්‍ය වන්නේ,**

1. වැරදි නිවැරදි කිරීමට ජ'නල් සටහන් **(සංලක්ෂය සමඟ)**
2. 2023.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා හවුල් ව්‍යාපාරයේ නිවැරදි ලාභය දක්වන ප්‍රකාශනයක්
3. 2023.03.31 දිනට හවුල්කරුවන්ගේ ප්‍රාග්ධනය හා ජංගම ගිණුම්

# Suggested Answers

| | | | | |
|---|---|---|---|---|
| **1)** 1 | **2)** 3 | **3)** 5 | **4)** 2 | **5)** 1 |
| **6)** 4 | **7)** 1 | **8)** 2 | **9)** 3 | **10)** 3 |
| **11)** 5 | **12)** 2 | **13)** 5 | **14)** 3 | **15)** 4 |
| **16)** 5 | **17)** 1 | **18)** 1 | **19)** 3 | **20)** 1 |
| **21)** 4 | **22)** 3 | **23)** 4 | **24)** 2 | **25)** 2 |
| **26)** 2 | **27)** 3 | **28)** 1 | **29)** 4 | **30)** 4 |
| **31)** 2 | **32)** 5 | **33)** 4 | **34)** 1 | |

(35)

1) ආරක්ෂණ සංකල්පය
2) උපලබ්ධි / උපචිත සංකල්පය
3) හරාත්මකබවේ සංකල්පය
4) ඓතිහාසික පිරිවැය සංකල්පය

(36)

1. ඉන්වොයිසිය, ගැණුම් ජ'නලය
2. ලදුපත, මුදල් ලැබීම් ජ'නලය
3. ගෙවීම් වවුචරය, මුදල් ගෙවීම් ජ'නලය
4. හරපත, ආපසු යැවුම් ජ'නලය

(37) A - අසත්‍ය, B - සත්‍ය, C - අසත්‍ය, D - සත්‍ය

(38)

A. වියදම්
B. වත්කම්
C. හිමිකම්
D. වගමකීම්

(39) අ. රු. 163,000

ආ. රු. 183,000

(40)

A. රු. 312,500
B. රු. 250,000
C. රු. 62,500

(41) මුදල් ගිණුම හර රු. 10,000

ප්‍රාග්ධන ගිණුම බැර - සඳුන් රු. 8,000

ප්‍රාග්ධන ගිණුම බැර - නුවන් රු. 2,000

(42) ණයහිමි පාලන ගිණුම හර රු. 20,000

ගැණුම් ගිණුම බැර රු. 20,000

(43)

I. රු. 90,000

II. හානිකරණ අලාභ ගිණුම හර රු. 9,500

හානිකරණ අලාභ සඳහා වෙන්කිරීම් ගිණුම රු. 9,500

(44) රු. 28,500 කින් අඩුවේ.

(45)

| | |
|---|---|
| 2022.04.01 සමුච්චිත අරමුදල | රු. 300,000 |
| අතිරික්තය | රු. 170,000 |
| ගොඩනැගිලි අරමුදල | රු. 270,000 |
| යාවජීව සාමාජික අරමුදල | රු. 150,000 |
| | රු. 890,000 |

# Suggested Answers

**01.**

| ගනුදෙනු අංකය | වත්කම් | | | | වගකීම් | | | හිමිකම |
|---|---|---|---|---|---|---|---|---|
| | දේපළ පි.උ | තොගය | වෙළෙඳ ලැබිය යුතු දෑ | මුදල් | දිගු කාලීන ණය | වෙළෙඳ ගෙවිය යුතු දෑ | වෙනත් ගෙවිය යුතු දෑ | |
| 1. | | 50 | + 80 | | | | | + 30 |
| 2. | | + 5 | 10 | | | | | 5 |
| 3. | | | | + 400 | + 400 | | + 36 | 36 |
| 4. | + 200 | | | 200 | | | | |
| 5. | | | | 6 | | | | 14 |
| | | | | | | | | + 8 |
| 6. | | | | 15 | | | | 15 |
| 7. | | 20 | | | | | | 20 |
| 8. | | | 50 | 30 | | 80 | | |
| 9. | | | 80 | + 72 | | | | 8 |
| 10. | | | | + 10 | | | | +10 |
| | 200 | 65 | 60 | 231 | 400 | 80 | + 36 | 50 |

2.

| | |
|---|---|
| නිවැරදි කිරීමට පෙර මුදල් ශේෂය | 200 |
| ඉහත ගනුදෙනු වලින් වූ බලපෑම | 231 |
| | 431 |
| 2020.03.31 දිනට සංශෝධිත මුදල් ශේෂය | 431 |

3.

| | | (රු'000) |
|---|---|---|
| කෙටුම්පත් ලාභය | | 1000 |
| + දළ ලාභය (80 50) | 30 | |
| බොල් ණය ලැබීම් | 10 | 40 |
| | | 1040 |
| ආපසු එවුම් මත ලාභය | 5 | |
| ණය පොලිය | 36 | |
| මෙහෙයුම් වියදම් | 14 | |
| පරිත්‍යාග වියදම් | 20 | |
| දුන් වට්ටම් | 8 | (83) |
| | | 957 |

**02.**

**බැංකු පොත (ජනවාරි)**

| | | | |
|---|---|---|---|
| ඉ/ගෙ/ ශේෂය | 400 | නිකුත් කිරීම් | 500 |
| ලැබීම් | 600 | ප/ගෙ/ ශේෂය | 500 |
| | 1000 | | 1000 |

**සංශෝධිත බැංකු පොත**

| | | | |
|---|---|---|---|
| ඉ/ගෙ/ ශේෂය | 500 | බැංකු ගාස්තු | 15 |
| ණයගැති ප්‍රේෂණ | 40 | අගරු චෙක් | 30 |
| | | ස්ථාවර නියෝග | 50 |
| | | ප/ගෙ/ ශේෂය | 445 |
| | 540 | | 540 |

**බැංකු සැසඳුම් ප්‍රකාශනය**

| | | |
|---|---|---|
| සංශෝධිත බැංකු පොතේ ශේෂය | | 445 |
| (+) නිකුත් කළ නමුත් ගෙවීමට ඉදිරිපත් නොවූ චෙක් (500 380) | 120 | |
| දෙසැම්බර් (80 50) | 30 | 150 |
| | | 595 |
| ( ) තැම්පත් කළ නමුත් උපලබ්ධි නොවූ චෙක් (600 30 = 570 440) | 130 | |
| දෙසැම්බර් | 0 | |
| | | (130) |
| බැංකු ප්‍රකාශනයට අනුව ශේෂය | | 465 |

❖ ජනවාරි මාසය තුළ 600 000 ක චෙක් තැන්පත් කළ ද 30 000 ක චෙක්පත් අගරු වී ඇති බැවින් බැංකුවට ඉදිරිපත් විය යුත්තේ 570 000 ක චෙක් පමණයි. එම චෙක් වලිනුත් බැංකුවේ තැන්පත් වී ඇත්තේ 440 000 ක් පමණයි.

**03.**

**පොදු ජ'නලය**

| | | | |
|---|---|---|---|
| (1) ණයගැති ගිණුම | (හර) | 3.6 | |
| දුන් වට්ටම් ගිණුම | | | 3.6 |
| (දුන් වට්ටම් වැඩියෙන් සටහන් කිරීම නිවැරදි කළා) | | | |
| (2) විකුණුම්/ලාභාලාභ ගිණුම | (හර) | 20 | |
| අවිනිශ්චිත ගිණුම | | | 20 |
| (විකුණුම් එම ගිණුමෙන් දෙවරක් සඳහන් කිරීමනිවැරදි කළා) | | | |
| (3) ණයහිමි ගිණුම | (හර) | 20 | |
| අවිනිශ්චිත ගිණුම | | | 20 |
| වරිපනම් ගිණුම/ ලාභාලාභ ගිණුම | (හර) | 10 | |
| අවිනිශ්චිත ගිණුම | | | 10 |
| (ගෙවීම් අදාළ ගිණුමේ පිටපත් නොවීම නිවැරදි කළා) | | | |

**නිවැරදි ශේෂ සෙවීමේ ලේඛනය**

| | | |
|---|---|---|
| කෙටුම්පත් ශුද්ධ ලාභය | | 450 |
| (+) දුන් වට්ටම් | 3.6 | 3.6 |
| | | 453.6 |
| ( ) විකුණුම් | 20 | |
| වරිපනම් | 10 | |
| | | 30 |
| ශුද්ධ ලාභය | | 423.6 |

**පෙරවැඩ :-**

**අවිනිශ්චිත ගිණුම**

| | | | |
|---|---|---|---|
| ඉ/ගෙ/ශේෂය | 50 | විකුණුම් | 20 |
| | | ණයහිමි | 20 |
| | | වරිපනම් | 10 |
| | 50 | | 50 |

**මූල්‍ය තත්ව ප්‍රකාශනය**

| | | |
|---|---|---|
| ස්ථාවර වත්කම් | | |
| දේපළ පිරියත හා උපකරණ | | 800 |
| ජංගම වත්කම් | | |
| තොග | 300 | |
| ණය ගැතියෝ (100 + 3.6) | 103.6 | |
| බැංකු මුදල් | 50 | 453.6 |
| | | 1253.6 |
| ප්‍රාග්ධනය | 700 | |
| (+) ශුද්ධ ලාභය | 423.6 | |
| | | 1123.6 |
| දිගු කාලීන වගකීම් | | |
| ජංගම වගකීම් | | |
| ණය හිමියෝ (150 20) | 130 | 130 |
| | | 1253.6 |

**04.**

| 05. ලාභාලාභ විසර්ජන ගිණුම | | |
|---|---|---|
| ඉ/ගෙ/ ශුද්ධ ලාභය | | 207 |
| ප්‍රාග්ධන පොලී | | |
| අසිත | 36 | |
| ලසිත | 26 | |
| විසිත | 20 | |
| හවුල් වේතන | | |
| අසිත | 45 | |
| ලසිත | 35 | |
| විසිත | | (162) |
| ලාභ කොටස් | | 45 |
| අසිත | 15 | |
| ලසිත | 15 | |
| විසිත | 15 | (45) |

| | | |
|---|---|---|
| | | 0 |

**පොදු ජ'නලය**

| | | |
|---|---|---|
| (1) ලාභාලාභ ගිණුම (හර)<br>විසිතගේ ජංගම ගිණුම | 5 | <br>5 |
| (2) හවුල්කරුවන්ගේ ජංගම ගිණුම් (හර)<br>ලාභලාභ ගිණුම | 18 | <br>18 |
| (3) ලාභලාභ ගිණුම (හර)<br>තොග ගිණුම | 24 | <br>24 |
| (4) ලාභලාභ ගිණුම (හර)<br>කලින් ලද කුලී | 6 | <br>6 |
| (5) ලාභලාභ ගිණුම (හර)<br>ක්ෂය වෙන් කිරීමේ ගිණුම | 28 | <br>28 |

**නිවැරදිව ශුද්ධ ලාභය සෙවීමේ ලේඛනය**

| | | | |
|---|---|---|---|
| | කෙටුම්පත් ශුද්ධ ලාභය | | 252 |
| (+) | ගැනිලි | 18 | 18 |
| | | | 270 |
| ( ) | ණය පොලී | 5 | |
| | තොග | 24 | |
| | කලින් ලද කුලී | 6 | |
| | ක්ෂය | 28 | |
| | | | (63) |
| | | | 207 |

**ජංගම ගිණුම**

| | අසිත | ලසිත | විසිත | | අසිත | ලසිත | විසිත |
|---|---|---|---|---|---|---|---|
| ඉ/ගෙ/ශේෂය | | 8 | | ඉ/ගෙ/ශේෂය | 12 | | |
| ගැනිලි | 10 | | | ණය පොලී | | | 5 |
| ප/ගෙ/ශේෂය | 56 | 30 | 40 | ප්‍රාග්ධනය | 24 | 16 | 20 |
| | | | | හවුල් වේතන | 15 | 15 | |
| | | | | ලාභ කොටස් | 15 | 15 | 15 |
| | 66 | 46 | 40 | | 66 | 46 | 46 |
| | | | | ප/ගෙ/ශේෂය | 56 | 30 | 40 |

**ප්‍රාග්ධන ගිණුම**

| | අසිත | ලසිත | විසිත | | අසිත | ලසිත | විසිත |
|---|---|---|---|---|---|---|---|
| කීර්ති නාමය | 30 | 30 | 30 | ඉ/ගෙ/ශේෂය | 350 | 250 | |
| | | | | මුදල් | | | 150 |
| | | | | කීර්ති නාමය | 45 | 45 | |
| | | | | ඉ/ගෙ/ශේෂය | 365 | 265 | 120 |
| | | | | ගබඩා ගොඩනැ. | | | 160 |
| ප/ගෙ/ශේෂය | 365 | 265 | 330 | ණය ගිණුම | | | 50 |
| | 365 | 265 | 330 | | 365 | 265 | 330 |

**05.**

**පොදු ජ'නලය**

| | | |
|---|---|---|
| 1. ණයගැති පාලන ගිණුම (හර)<br>විකුණුම් ගිණුම ලා/ලා ගිණුම<br>(විකුණුම් ජ'නලයේ එකතුව අඩුවෙන් පිටපත් කිරීම නිවැරදි කළා | 3 150 | <br>3 150 |
| 2. අවිනිෂ්චිත ගිණුම (හර)<br>ණයගැති පාලන ගිණුම<br>(දුන් වට්ටම් පාලන ගිණුමට හර කිරීම නිවැරදි කළා) | 600 | <br>600 |
| 3. ණයහිමි පාලන ගිණුම (හර)<br>ගැනුම් ගිණුම ලා/ලා ගිණුම<br>(ගැනුම් ජ'නලයේ එකතුව වරදවා පිටපත් කිරීම නිවැරදි කළා) | 3 600 | <br>3 600 |
| 4. විකුණුම් /ලා/ලා ගිණුම (හර)<br>ආපසු යැවුම් ගිණුම | 30 | <br>30 |

නිවැරදි ලාභය හෝ අලාභය සෙවීමේ ලේඛනය

| | | |
|---|---|---|
| කෙටුම්පත් ශුද්ධ අලාභය | | (4 000) |
| (+) විකුණුම් | 3 150 | |
| ගැනුම් | 3 600 | |
| ආපසු යැවුම් | 30 | 6 780 |
| | | 2 780 |
| ( ) විකුණුම් | 30 | |
| | | 30 |
| නිවැරදි ශුද්ධ ලාභය | | 2 750 |

(ආපසු යැවුම් වරදවා පිටපත් කිරීම නිවැරදි කළා)

3. වැරදි නිවැරදි කිරීමට පෙර

ණයගැති පාලන ගිණුම

| | | | |
|---|---|---|---|
| විකුණුම් | 350 | මුදල් | 2 100 |
| දුන් වට්ටම් | 300 | | |
| ප/ගෙ/ ශේෂය | 1 450 | | |
| | 2 100 | | 2 100 |

4. වැරදි නිවැරදි කළ පසු

ණයගැති පාලන ගිණුම

| | | | |
|---|---|---|---|
| ආපසු යැවුම් | 30 | ගැනුම් | 2 680 |
| ලද වට්ටම් | 150 | | |
| මුදල් | 950 | | |
| ප/ගෙ/ ශේෂය | 2 680 | | 2 680 |

06.

(රු‘000)

| ගනුදෙනු අංකය | වත්කම් | | | | වගකීම් | | |
|---|---|---|---|---|---|---|---|
| | දේ.ප.පි.උ | තොගය | ණයගැතියෝ | මුදල් | හිමිකම | බැංකු ණය | ණය හිමියා |
| 1. | | + 200 | | - 200 | | | |
| 2. | | 120 | | + 200 | + 80 | | |
| 3. | | + 300 | | | | | + 300 |
| 4. | | 50 | | | | | 50 |
| 5. | + 300 | | | | | + 300 | |
| 6. | | 150 | +300 | | + 150 | | |
| 7. | | | | 30 | 30 | | |
| 8. | | | | 40 | 40 | | |
| 9. | | | | 225 | + 25 | | 250 |
| 10. | | | 300 | 270 | 30 | | |

2. ආදායම් ප්‍රකාශනය

| | | |
|---|---|---|
| විකුණුම් (200+300) | | 500 |
| ( ) විකුණුම් පිරිවැය (120+150) | | (270) |
| දළ ලාභය | | 230 |
| (+) වෙනත් ආදායම් | | |
| ලද වට්ටම් | 25 | 25 |
| | | 225 |
| ( ) වියදම | | |
| ලොරිය ක්ෂය | 6 | |
| පරිගණක ක්ෂය | 1.5 | |
| අලෙනි වැටුප් | 30 | |
| දුන් වට්ටම | 30 | |
| වරිපනම් | 6 | |
| | | (73.5) |
| | | 181.5 |

3.

| | |
|---|---|
| ආරම්භක ප්‍රාග්ධනය | 1 000 |
| (+) කාලච්ඡේදයේ ලාභය | 181.5 |
| | 1 181.5 |
| ( ) ගැනිලි | (40) |
| 2023.03.31 දිනට හිමිකම | 1 141.5 |

07.

**අමල්, කමල් හා විමල් හවුල් ව්‍යාපාරයේ**
**2023.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා**
**ලාභලාභ සහ විසර්ජන ගිණුම**

**(රු‘000)**

| | | |
|---|---|---|
| දළ ලාභය | | 500 |

| | | |
|---|---|---|
| (+) වෙනත් ආදායම් | | |
| ( ) වියදම් | | |
| දේපළ පිරියත ක්ෂය | 65 | |
| වේතන | 96 | |
| ගොඩනැගිලි කුලී | 72 | |
| බෙදාහැරීමේ වියදම් (1693) | 166 | |
| ණයපොලී - කමල් | 5 | |
| | | (404) |
| ඉ/ගෙ/ ශුද්ධ ලාභය | | 96 |
| ප්‍රාග්ධන පොලී | | |
| අමල් | 22 | |
| කමල් | 18 | |
| විමල් | 14 | |
| හවුල් වේතන | | |
| අමල් | 120 | |
| විමල් | 120 | (294) |
| | | (198) |
| අලාභ කොටස් | | |
| අමල් | 99 | |
| කමල් | 66 | |
| විමල් | 33 | (198) |
| | | 0 |

**ජංගම ගිණුම**

| | අමල් | කමල් | විමල් | | අමල් | කමල් | විමල් |
|---|---|---|---|---|---|---|---|
| මුදල් පාලන | 60 | - | 60 | ඉ/ගෙ/ශේෂය | 40 | 25 | |
| භාණ්ඩ ගැනිලි | 10 | 5 | 5 | ණය පොලී | - | 5 | |
| වියදම් ගැනිලි | 3 | | | ප්‍රාග්ධන පොලී | 22 | 18 | 14 |
| අලාභ කොටස් | 99 | 66 | 33 | හවුල් වේතන | 120 | | 120 |
| ප/ගෙ/ශේෂය | 10 | | 36 | ප/ගෙ/ශේෂය | | 23 | |
| | 182 | 71 | 134 | | 182 | 71 | 134 |

**ප්‍රාග්ධන ගිණුම**

| | අමල් | කමල් | විමල් | | අමල් | කමල් | විමල් |
|---|---|---|---|---|---|---|---|
| කීර්තිනාමය | 30 | 20 | 10 | ඉ/ගෙ/ශේෂය | 214 | 176 | |
| | | | | මුදල් | | | 50 |
| | | | | පරිගණක | | | 100 |
| | | | | කීර්තිනාමය | 36 | 24 | |
| ප/ගෙ/ශේෂය | 220 | 180 | 140 | | | | |
| | 250 | 200 | 150 | | 250 | 200 | 150 |

**මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය**

| | | |
|---|---|---|
| ජංගම නොවන වත්කම් | | |
| දේපළ පිරියත හා උපකරණ | 650 | |
| ( ) සමුච්චිත ක්ෂය (50+65) | (115) | 535 |
| ජංගම වත්කම් | | |
| ජංගම වත්කම් | 214 | 214 |
| | | 749 |
| ප්‍රාග්ධන ගිණුම | | |
| අමල් | 220 | |
| කමල් | 180 | |
| විමල් | 140 | |
| | | 540 |
| ජංගම ගිණුම | | |
| අමල් | 10 | |
| කමල් | (23) | |
| විමල් | 36 | 23 |
| ජංගම නොවන වගකීම් | | |
| කමල් ණය ගිණුම | 100 | 100 |

| | | |
|---|---|---|
| ජංගම වගකීම් | | |
| උපචිත ගොඩනැගිලි කුලී | 21 | |
| ජංගම වගකීම් | 65 | 86 |
| | | 749 |

08.

**ණයගැති පාලන ගිණුම**

| | | | |
|---|---|---|---|
| ඉ/ගෙ/ ශේෂය | 264 000 | මුදල් | 6 100 000 |
| විකුණුම් | 7 000 000 | අඩමාණ - බොල්ණය | 40 000 |
| | | බොල්ණය | 15 000 |
| | | ප/ගෙ/ ශේෂය | 1 109 000 |
| | 7 264 000 | | 7 264 000 |

**බොල් ණය ගිණුම**

| | | | |
|---|---|---|---|
| ණයගැති පාලන ගිණුම | 15 000 | අදා/වියදම් | 15 000 |

**මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය**

| | |
|---|---|
| ජංගම වත්කම් | |
| ණය ගැතියෝ | 1 109 000 |
| ( ) අඩමාණ ණය | (109 350) |
| | 999 650 |

පෙර වැඩ :
ආරම්භක ශේෂය

| | අඩමාණ | ණයගැති |
|---|---|---|
| විශ්ව | 40 000 | 40 000 |
| කමල් | 32 000 | 32 000 |
| අරුණ | 16 000 | 32 000 |
| අනෙකුත් | 8 000 | 160 000 |
| | 96 000 | 264 000 |

**අඩමාණ ණය වෙන් කිරීමේ ගිණුම**

| | | | |
|---|---|---|---|
| ණ/ගැ. බොල් | 40 000 | ඉ/ගෙ/ ශේ | 96 000 |
| | | අදා/විය | 53 350 |
| ප/ගෙ/ ශේ | 109 350 | | |
| | 149 350 | | 149 350 |

| | අඩමාණ | ණයගැති |
|---|---|---|
| කමල් | 32 000 | 32 000 |
| ලංකා | 20 000 | |
| සම්පත් | 10 000 | |
| ඉතිරි | 1 047 000 | 52 350 |
| | 1 109 000 | 109 350 |

$1047\ \not{000} \times \frac{5}{\not{100}}$

$= \underline{\underline{52\ 350}}$

09.

**සංශෝධිත මුදල් පාලන ගිණුම**

| | | | |
|---|---|---|---|
| ඉ/ගෙ ශේෂය | 6 000 | අඩුවෙන් සටහන් කිරීම | 400 600 |
| ස්ථාවර තැම්පතු පොලී | 1 200 | බැංකු ගාස්තු | |
| ලද ලාභාංශ | 3 000 | | |
| ඉතිරි කිරීමේ ගිණුම | 1 200 | | |
| | | ප/ගෙ/ ශේෂය | 10 400 |
| | 11 400 | | 11 400 |
| ඉ/ගෙ ශේෂය | 10 400 | | |

**බැංකු සැසඳුම් ප්‍රකාශය**

| | | |
|---|---|---|
| සංශෝධිත මුදල් පාලන ගිණුමේ ශේෂය | | 10 400 |
| (+) නිකුත් කළ නමුත් ගෙවීමට ඉදිරිපත් නොවූ චෙක් | 6000 | |
| කල් ඉකුත් වූ චෙක් | (600) | 5 400 |
| | | 15 800 |
| ( ) තැම්පත් කළ නමුත් උපලබ්ධි නොවූ චෙක් | 7 000 | |
| | | (7 000) |

| | | |
|---|---|---|
| බැංකු ප්‍රකාශනයට අනුව ශේෂය | | 8 800 |

10.

**සාමාජික මුදල් ගිණුම**

| | | | |
|---|---|---|---|
| ඉ/ගෙ ශේෂය | 11 | ඉ/ගෙ ශේෂය | 0 |
| ආදායම් වියදම් (70×400) | 28 | ලැබීම් ගෙවීම | 27 |
| ප/ගෙ/ ශේෂය | 7 | ප/ගෙ/ ශේෂය | 19 |
| | 46 | | 46 |

**යාවජීව සාමාජික මුදල් ගිණුම**

| | | | |
|---|---|---|---|
| | | ඉ/ගෙ ශේෂය | xxx |
| ආදායම් වියදම් (70×400) | 4 | ලැබීම් ගෙවීම | 40 |
| ප/ගෙ/ ශේෂය | 36 | | |
| | 40 | | 10 |

**ආපනශාලා වෙළෙඳ ගිණුම**

| | | | |
|---|---|---|---|
| ආරම්භක තොගය | 12 | විකුණුම් | 74 |
| (+) ගැනුම් | 18 | | |
| | 30 | | |
| ( ) අවසාන තොගය | (21) | | |
| විකුණුම් පිරිවැය | 9 | | |
| ප/ගෙ/ ශේෂය | 65 | | |
| | 74 | | 75 |
| | | ඉ/ගෙ ශේෂය | 65 |
| වැටුප් | 10 | | |
| ශුද්ධ ලාභය | 55 | | |
| | 65 | | 65 |

**මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය**

| | | |
|---|---|---|
| ස්ථාවර වත්කම් | | |
| ලී බඩු | 38 | 38 |
| ජංගම වත්කම් | | |
| අවසාන තොගය | 21 | |
| ලැබීම් ගෙවීම් ශේෂය | 194 | |
| හිඟ සාමාජික මුදල් | 19 | |
| | | 234 |
| | | 272 |
| සමුච්චිත අරමුදල | 278 | |
| අතිරික්තය | 11 | 229 |
| දිගු කාලීන වගකීම් | | |
| යාවජීව සාමාජික | 32 | 32 |
| ජංගම වගකීම් | | |
| කලින් ලද සාමාජික මුදල් | 7 | |
| යාවජීව සාමාජික | 4 | 11 |
| | | 272 |

**ආදායම් වියදම් ගිණුම**

| | | |
|---|---|---|
| ආදායම් | | |
| යාවජීව සාමාජික ආදායම | | 4 |
| සාමාන්‍ය සාමාජික මුදල් | | 28 |
| ආපනශාලාවේ ලාභය | | 55 |
| කුලී ආදායම | | 01 |
| | | 88 |
| ( ) වියදම් | | |
| ලිපිකරු වැටුප් | 30 | |
| ලී බඩු ක්ෂය (42 38) | 4 | |
| කුලී ගෙවීම් | 34 | |
| දුරකථන ගාස්තු | 9 | (77) |
| අතිරික්තය | | 11 |

පෙර වැඩ

**2020.01.01 දිනට තත්ත්ව විස්තරය**

| | | | |
|---|---|---|---|
| සමුච්චිත අරමුදල | 218 | හිඟ සාමු. | 11 |
| | | ආරම්භක තොගය | 12 |
| | | ලී බඩු | 42 |
| | | මුදල් | 153 |
| | 280 | | 218 |

**ක්‍රීඩාංගනය කුලියට දීම**

| | | |
|---|---|---|
| ආදායම් | | |
| කුලී ආදායම් | | 53 |
| වියදම් | | |
| වැටුප් | 40 | |
| ක්‍රීඩාංගනයක සකස් කි.වි | 12 | (25) |
| | | 01 |

11.

**පොදු ජ'නලය**

| | | |
|---|---|---|
| 1. හවුල්කරුවන්ගේ ජංගම ගිණුම (හර)<br>ලාභාලාභ ගිණුම/ රක්ෂණ වියදම<br>(පුද්ගලික රක්ෂණ වියදම් ව්‍යාපාරයේ වියදමක් ලෙස සටහන් කිරීම නිවැරදි කළා) | 300 | 300 |
| 2. හවුල්කරුවන්ගේ ජංගම ගිණුම (හර)<br>ලාභාලාභ ගිණුම<br>(හවුල් වේතන ලාභාලාභ ගිණුමේ වායදමක් ලෙස සටහන් කිරීම නිවැරදි කළා) | 60 | 60 |

| | | | |
|---|---|---|---|
| 3. | ලාභ ලාභ ගිණුම/ ණය පොලී (හර)<br>රයන්ගේ ජංගම ගිණුම<br>(රයන්ට ගෙවිය යුතු ණය පොලී ගිණුම් ගත කළා) | 15 | 15 |

**නිවැරදි ශුද්ධ ලාභය සෙවීමේ ලේඛනය**

| | | |
|---|---|---|
| කෙටුම්පත් ශුද්ධ ලාභය | | 485 |
| (+) රක්ෂණ වියදම් | 300 | |
| වැටුප් | 60 | 360 |
| | | 845 |
| ( ) | | |
| ණය පොලිය | 15 | |
| | | (15) |
| නිවැරදි ශුද්ධ ලාභය | | 830 |

**ප්‍රාග්ධන ගිණුම**

| | R | B | I | K | | R | B | I | K |
|---|---|---|---|---|---|---|---|---|---|
| කීර්තිනාමය | 400 | 400 | | 400 | ඉ/ගෙ/ ශේය | 500 | 400 | 200 | |
| ණය ගිණුම | | | 552 | | ජංගම ගිණුම | | | 152 | |
| | | | | | මුදල් | | | | 400 |
| | | | | | කීර්තිනාමය | 600 | 400 | 200 | |
| ප/ගෙ/ශේෂය | 700 | 400 | | 0 | | | | | |
| | 1 100 | 800 | 552 | 400 | | 1 100 | 800 | 552 | 400 |
| | | | | | ඉ/ගෙ/ශේෂය | 700 | 400 | | 0 |

**ජංගම ගිණුම**

| | R | B | I | | R | B | I |
|---|---|---|---|---|---|---|---|
| ඉ/ගෙ ශේෂය | | 20 | | ඉ/ගෙ ශේෂය | | | |
| රක්ෂණ ගාස්තු | 100 | 200 | | ණය පොලී | | | |
| මුදල් (වැටුප්) | 30 | 18 | 12 | ප්‍රාග්ධන පොලී | | | |
| ප්‍රාග්ධන ගිණුම | | | 152 | හවුල් වේතන | | | |
| | | | | ලාභ කොටස් | | | |
| ප/ගෙ ශේෂය | 345 | 38 | | | | | |
| | 475 | 276 | 164 | | 475 | 276 | 164 |

12.

**සංශෝධිත මුදල් පාලන ගිණුම**

| | | | |
|---|---|---|---|
| අවිනිශ්චිත ගිණුම | 12 000 | ඉ/ගෙ/ ශේෂය | 193 000 |
| ලාභාංශ ආදායම | 21 000 | බැංකු ගාස්තු | 8 000 |
| සෘජු ප්‍රේෂණ | 53 000 | රක්ෂණ ගාස්තු | 12 000 |
| ප/ගෙ ශේෂය | 127 000 | | |
| | 213 000 | | 213 000 |

**බැංකු සැසඳුම් ප්‍රකාශය**

| | | |
|---|---|---|
| සංශෝධිත මුදල් පාලන ගිණුමේ ශේෂය | | (127000) |
| (+) නිකුත් කළ නමුත් ඉදිරිපත් නොවූ චෙක් | 80 000 | |
| | | 80 000 |
| | | (47 000) |
| ( ) තැම්පත් කළ නමුත් උපලබ්ධි නොවූ චෙක් | 48 000 | |
| | | (48 000) |
| බැංකු ප්‍රකාශනයට අනුව ශේෂය | | (95 000) |

13.

**ලැබීම් ගෙවීම් ගිණුම**

| | | | |
|---|---|---|---|
| ඉ/ගෙ/ ශේෂය | 700 | ගායකයන්ට | 240 |

| | | | |
|---|---|---|---|
| සාමාජික මුදල් | 300 | සංගීත කණ්ඩායමට ගෙ | 120 |
| යාවජීව සාමාජික මුදල් | 200 | ශාලා කුලි | 60 |
| ප්‍රවේශ පත්‍ර අලෙ. ආ | 260 | වෙනත් වියදම් | 40 |
| අනුග්‍රහක ලැබීම් | 750 | ටී - ෂර්ට් ගැනුම් | 264 |
| ටී ෂර්ට් විකුණුම් | 420 | පරිපාලන වියදම් | 20 |
| | | සේවක වැටුප් | 60 |
| | | ප/ගෙ/ ශේෂය | 1 816 |
| | 2 630 | | 2 630 |

**ආදායම් වියදම් ගිණුම**

| | | |
|---|---|---|
| ආදායම් | | |
| සාමාජික මුදල් ආදායම | | 300 |
| යාවජීව සාමාජික මුදල් | | 90 |
| ටී ෂර්ට් ලාභය | | 180 |
| සංගීත ප්‍රසංගයේ ලාභය | | 830 |
| | | 1 400 |
| වියදම් | | |
| පරිපාලන වියදම් | 20 | |
| සේවක වැටුප් (60 + 10) | 70 | |
| කාර්යාල උපකරණ ක්ෂය | 150 | |
| | | (240) |
| අතිරික්තය | | 1 160 |

**සාමාජික මුදල් ගිණුම**

| | | | |
|---|---|---|---|
| ඉ/ගෙ/ ශේෂය | 150 | ඉ/ගෙ/ ශේෂය | 250 |
| ආදායම් වියදම් (500 × 600) | 300 | ලැබීම් ගෙවීම් | 300 |
| ප/ගෙ/ ශේෂය | 300 | ප/ගෙ/ ශේෂය | 200 |
| | 750 | | 750 |

**සංගීත ප්‍රසංගයේ ආදායම් වියදම් ගිණුම**

| | | |
|---|---|---|
| ආදායම් | | |
| ප්‍රවේශ පත්‍ර අලෙවිය | | 300 |
| අනුග්‍රාහක ලැබීම් | | 1 000 |
| | | 1 300 |
| වියදම් | | |
| ගායකයන් ගෙවූ මුදල (50 000 × 50) | 250 | |
| සංගීත කණ්ඩායම | 120 | |
| ශාලා කුලි | 60 | |
| වෙනත් වියදම් | 40 | (470) |
| | | 830 |

**ටී. ෂර්ට් ආදායම් වියදම් ගිණුම**

| | | |
|---|---|---|
| ආදායම් | | |
| විකුණුම් (700 × 600) | | 420 |
| ගැනුම් (400 × 660) | 264 | |
| ( ) අවසාන තොගය | (24) | 240 |
| | | 180 |

14.

**සංශෝධිත ණයගැති පාලන ගිණුම**

| | | | |
|---|---|---|---|
| ඉ/ගෙ/ ශේෂය | 4 500 | බොල් ණය | |
| විකුණුම් | 2 000 | අවිනිශ්චිතදුන් වට්ටම් | |
| | | ඉ /ගෙ/ ශේෂය | |
| | 6 500 | | 6 500 |

**නිවැරදි ශුද්ධ ලාභය සෙවීමේ ලේඛනය**

| | | |
|---|---|---|
| කෙටුම්පත් ශුද්ධ ලාභය | | 1 140 |
| (+) විකුණුම් | 2 000 | |
| | | 2 000 |
| | | 3 140 |
| ( ) බොල් ණය | 400 | |
| සටහන් නොවූ ආපසු එවුම් | | (400) |
| නිවැරදි ශුද්ධ ලාභය | | 2 740 |

**ණයගැති ශේෂය සෙවීමේ ලේඛනය**

| | | |
|---|---|---|
| කෙටුම්පත් ණයගැති ශේෂය | | 3 100 |
| (+) මහහැරුණු ණයට විකුණුම් | 4 000 | |
| | | 4 000 |
| | | 7 100 |
| ( ) වැරදි හර කිරීම | 600 | |
| සටහන් නොවූ ආපසු එවුම් | 500 | |
| | | (1 100) |
| නිවැරදි ණයගැති ශේෂය | | 6 000 |

**පොදු ජ'නලය**

| | | |
|---|---|---|
| ණයගැති පාලන ගිණුම (හර)<br>විකුණුම් /ලාභාලාභ ගිණුම<br>(විකුණුම් අඩුවෙන් පිටපත් කිරීම නිවැරදි කළා.) | 2 000 | 2 000 |
| බොල්ණය ගිණුම්/ ලා/ලා.ගි (හර)<br>ණයගැති පාලන ගිණුම<br>(බොල්ණය කපා හැරීම ගිණුම් ගත කළා.) | 400 | 400 |
| අවිනිශ්චිත ගිණුම (හර)<br>ණයගැති පාලන ගිණුම<br>(දුන් වට්ටම් පාලන ගිණුමේ අඩුවෙන් පිටපත් කිරීම නිවැරදි කිරීම) | 100 | 100 |

15.

**නිවැරදි ශුද්ධ ලාභය සෙවීමේ ලේඛනය (රු'000)**

| | | |
|---|---|---|
| කෙටුම්පත් ශුද්ධ ලාභය | | 1 850 |
| (+) රක්ෂණ වියදම් | 210 | |

| | | |
|---|---|---|
| සේවක වැටුප් | 270 | |
| නඩත්තු වියදම් | 500 | 980 |
| | | 2 830 |
| ( ) පොලී වියදම් | 200 | |
| පොලී ආදායම් | 20 | |
| ක්ෂය | 50 | |
| | | (270) |
| නිවැරදි ශුද්ධ ලාභය | | 2 560 |

**පොදු ජ'නලය**

| | | | |
|---|---|---|---|
| සසංකාගේ ජංගම ගිණුම<br>ලාභ ලාභ ගණුම (රක්ෂණ වි.)<br>(ගැනිලි වියදමක් ලෙස සටහන් කිරීම නිවැරදි කළා.) | (හර) | 210 | 210 |
| පොලී වියදම් ගිණුම/ලා/ලා ගිණුම<br>පොලී වියදම් ගිණුම/ලා/ලා ගිණුම<br>අවිනිශ්චිත ගිණුම<br>(බැංකු ණය පොලිය ආදායමක් ලෙස සටහන් වීම නිවැරදි කළා) | (හර)<br>(හර) | 200<br>20 | 220 |
| අවිනිශ්චිත ගිණුම<br>සේවක වැටුප් /ලා ලා ගි.<br>(වැටුප් එම ගිණුමේ වැඩියෙන් සටහන් කිරීම නිවැරදි කළා)<br>මෝටර් රථ ගිණුම<br>මෝ/ර නඩත්තු වියදම් ගි.<br>(වත්කමක් වියදම් ගිණුමක සටහන් කිරීම නිවැරදි කළා) | (හර)<br><br><br>(හර) | 270<br><br><br>500 | 270<br><br><br>500 |
| මෝටර් රථ ක්ෂය/ ලා/ලා/ගි.<br>මෝ/ර ක්ෂය වෙන් කිරීමේ<br>(මෝටර් රථවල වාර්ෂික ක්ෂය ගිණුම් ගත කළා) | (හර) | 50 | 50 |

**ජංගම ගිණුම**

| | A | R | S | | A | R | S |
|---|---|---|---|---|---|---|---|
| ගැනිලි | | | 210 | ඉ/ගෙ/ශේෂය | 600 | 400 | 300 |
| ප්‍රාග්ධනය | 1 760 | | | ප්‍රාග්ධන පොලී | 540 | 420 | 240 |
| | | | | හවුල් වේතන | 120 | 120 | 120 |
| | | | | ලාභ කොටස් | 500 | 300 | 200 |
| ප/ගෙ/ශේෂය | | 1 240 | 650 | | | | |
| | 1 760 | 1 240 | 860 | | 1 760 | 1 240 | 860 |

**ප්‍රාග්ධන ගිණුම**

| | A | R | S | | A | R | S |
|---|---|---|---|---|---|---|---|
| කීර්ති නාමය | | 600 | 400 | ඉ/ගෙ/ ශේෂය | 5 400 | 4 200 | 2 400 |
| | | | | කීර්ති නාමය | 500 | 300 | 200 |
| | | | | ජංගම | 1 760 | | |
| ණය ගිණුම | 7 660 | | | | | | |
| ප/ගෙ/ ශේෂය | | 3 900 | 2 200 | | | | |
| | 7 660 | 4 500 | 2 600 | | 7 660 | 4 500 | 2 600 |

OXFORD BROOKES UNIVERSITY

Think Ahead ACCA

# Are you awaiting your A/L Results?

## Obtain ACCA Professional qualification + BSc (Hons) degree within 2 ½ years.



With ACCA you can obtain a BSc (Hons) degree in applied accounting from Oxford Brooks university and ACCA professional qualification within two and a half years without doubling your workload and investment.

Oxford Brooks University:

- Is the only UK university ranked in the QS world rankings of top 50 institutions under 50 years old (QS, 2021)
- Is among the world elite in 13 subjects (QS, 2020),
- Currently ranks 2nd in teaching in the Times Higher Education (THE) Young University Rankings 2020

**Registration open for A/L students from any stream.**
**Contact ACCA Sri Lanka on 0773874247/ 0112424801 to register or for more information.**

ACCA Sri Lanka. Block "A" 18th Floor, #33, Parkland, Park Street, Colombo 02




# ACCA + BSc (Hons) Degree in Applied Accounting within two and a half years.

Become a globally recognised finance professional with ACCA.

## Special offer for A/L students!

Make use of this great opportunity and expand your career mobility. Call **0112424801** / **0773874247** or email **info@lk.accaglobal.com** for more details.

ACCA Sri Lanka, Block A, 18 Floor, 33, Parkland, Park street, Colombo 2.